# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 90 — 1973 දෙසැම්බර් 14 වැනි සිකුරාදා — 1973.12.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (IIඅ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... ... | 1761 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1777 |



සැළකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 45 දරන ලොරි බලකර ලබා ගැනීමේ සහ අත්කර ගැනීමේ පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 46 දරන ධීවර (සංශෝධන) පනත 1973 දෙසැම්බර් මස 14 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ වේ.

## තනතුරු—ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරවනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළවන පොදු කොන්දේසි

**1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි.

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනෙක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නා වූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාළ තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන්ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

**2. දීමනා**

2 : 1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

1761—බී 71128—15,095 (73/12)

B 17

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

**3. සේවා කොන්දේසි : සාමාන්‍ය**

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

**4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

4 : 1 ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ :—

4 : 1 : 1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි "නව ප්‍රවේශකයන්" වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකිවූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් (අවශ්‍ය නම්), අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්‍ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාව කාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේදී සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4 සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේව යෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාව කාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන--සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9% ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6% ක් දක්වා වූ සෙවච්ඡා දායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

**6. යුද්ධ සේවා අනුග්‍රහය**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාවතීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්ටද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදා වන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස් වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම්තමන් සේවය කළ කාලයන් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදාලිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් ඇතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතු වනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

**8. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

---

අංකය : 2/1/113.

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කෘත්‍රිම සිංචන නිලධාරි තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘත්‍රිම සිංචන නිලධාරී තනතුරු සඳහා මෙයින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම් පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර හෝ ලේකම්, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය, 315, වොක්ෂෝල් වීදිය, තැ. පෙ. 569, කොළඹ 2 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත් : 1974 ජනවාරි මස 04 වැනිදා.
(බී) පිටරට ඉල්ලුම් පත් : 1974 ජනවාරි මස 11 වැනිදා.

**සංලක්ෂ්‍යය.**—(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියවිල්ලක් හෝ තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැකිය. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩු අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට තම ඉල්ලුම් පත් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි රටට හෝ ඊට ආසන්න තම රටට හෝ පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාලසීමාව ඇතුළතදී භාරදීමට කැමති නම් ඔවුන්ට එසේ කළ හැකිය.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා යානපත්‍ර.**—ශ්‍රී ලංකාවේදීම යටතේ සේවය සඳහා පත් කරනු පිණිස පිටරටින් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු විසින් පැවැත්වෙන පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණ සඳහා ගාස්තුවත් එසේම ලංකාවට පැමිණීම සඳහා වැයවන යානපත්‍ර වියදමත් එම නිලධාරීන් විසින්ම ගෙවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි.**—තනතුරු සථිරය. රජයේ අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම් ප්‍රථම වශයෙන් දෙනු ලබන්නේ අවුරුදු 3ක පරීක්ෂණ කාලයකට මතය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය :—අවුරුද්දකට රුපියල් 7,800න් පටන් ගෙන රුපියල් 360ක වාර්ෂික වැඩිවීම් 9 කින් හා රුපියල් 480 වාර්ෂික වැඩිවීම් 11කින්ද යුක්තව රුපියල් 16,320 දක්වා වැඩිවී යයි. (රුපියල් 11,040 සහ රුපියල් 14,400 යන වැටුප් තලයන්ට පෙර ක්‍රියාත්මක වන කාර්යක්ෂමතා කඩඉම් ඇත).

**සටහන.**—තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ට රුපියල් 11,040 වැටුප් තලය පසුකර යා හැක්කේ ශුක්‍රධාතු පරිහරණය කිරීම, සකස් කිරීම හා ගබඩා කිරීම පිළිබඳ නව්‍ය ක්‍රම ගැන නියමිත පුහුණුවක් ලබා ගැනීමෙන් පසුවය.

4. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ට චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ආ) 1974. 01. 04 වැනි දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි බව.
(දැනටමත් රජයේ සේවයෙහි නියුක්තව සිටින අයට මෙම වයස් සීමාව අදාළ නොවේ.)

(ඇ) (i) පහත සඳහන් සුදුසුකම් වලින් එකක් හෝ වැඩි ගණනක්—

1. ලංකා විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යාවේදී.
2. බොම්බාය විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී (පශු වෛද්‍ය).
3. මදුරාසි විශ්ව විද්‍යාලයේ, පශු වෛද්‍ය විද්‍යාවේදී.
4. පංජාබ විශ්ව විද්‍යාලයේ, පශු වෛද්‍ය විද්‍යාවේදී.
5. ඔස්මේනියා විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යාවේදී.
6. සෝගාර් විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යාවේදී.
7. කල්කටා විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යාවේදී.
8. අග්‍රා විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යා සහ සත්ව පාලනවේදී.
9. බිහාර් විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යා සහ සත්ව පාලනවේදී.
10. ගෞහාටි විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යා සහ සත්ව පාලනවේදී.
11. රාජ්පුටානා විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යා සහ සත්ව පාලනවේදී.
12. බොම්බාය පශු වෛද්‍ය විද්‍යාලයේ උපාධිධාරියකු.
13 මදුරාසි පශු වෛද්‍ය විද්‍යාලයේ උපාධිධාරියකු.
14. බෙංගාල පශු වෛද්‍ය විද්‍යාලයේ උපාධිධාරියකු.
15. පංජාබ පශු වෛද්‍ය විද්‍යාලයේ උපාධිධාරියකු.
16. බිහාර පශු වෛද්‍ය විද්‍යාලයේ උපාධිධාරියකු.
17. බලයලත් පශු වෛද්‍ය වෘත්තියක (පංජාබ).
18. පශු වෛද්‍ය විද්‍යා උපාධිධාරියකු (බෙංගාල).
19. ඩකා හි, නැගෙනහිර පකිස්තානු පශු වෛද්‍ය විද්‍යාලයේ, පශු වෛද්‍ය ඖෂධ සහ ශල්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක්.
20. ලන්ඩනයේ පශු වෛද්‍යවරුන්ගේ රාජකීය විද්‍යාලයේ සාමාජිකයකු.
21. පොදු රාජ්‍ය මණ්ඩලයේ කොටස්කරුවකු වන ඕනෑම රටක (ඉහත සඳහන් ඒවා සහ එක්සත් රාජධානිය හැරයි.) ඕනෑම විශ්ව විද්‍යාලයක පශු වෛද්‍ය ඖෂධ පිළිබඳ වෛද්‍යාචාර්යයකු හෝ පශු වෛද්‍ය විද්‍යාවේදියකු.
22. ඇමෙරිකා එක්සත් ජනපදයේ හෝ පිලිපයිනයේ පිළිගත් ඕනෑම විශ්ව විද්‍යාලයක පශු වෛද්‍ය ඖෂධ පිළිබඳ වෛද්‍යාචාර්යයකු.
23. නැගෙනහිර පකිස්තානු කෘෂිකාර්මික විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ බලපත්‍ර දරන්නකු.

24. නැගෙනහිර පකිස්තානයේ ඩැකා විශ්ව විද්‍යාලයේ (සත්ව පාලන) විද්‍යාවේදී.

හා

(iii) කෘෂිම සිංචන කටයුතු පිළිබඳව යටත් පිරිසෙයින් වසර පහක පළපුරුද්ද.

5. පහත සඳහන් ලියකියවිලි වලින් කිසිවක් හෝ සියල්ලම හෝ ඉදිරිපත් කරන ලෙස නියම කළ විටෙක ඒවා අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—උපකෘත පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කර ඇති බවුතීස්ම උප්පැන්න සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි සහතිකය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යයන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තිය සහ/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල භාෂාවෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

සංලක්ෂය : (i) ඉල්ලුම් පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කළ නොහැකිවන අපේක්ෂකයන්ගේ ඉල්ලුම් පත් ගැන සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, එම නිලධාරීන් විසින් තම ඉල්ලුම් පත් යැව්වේ කවදාද යන්න ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දින හෝ ඊටපෙර කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත කෙලින්ම ලියා දැන්විය යුතුය.

7. ඉල්ලුම් පත්‍ර සහ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි යැවිය යුත්තේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙතය. ඒවා මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූද රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන්නාවූද පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර මෙම කාර්යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති දෙකක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම මා වෙත දැනුම් දිය යුතුය.

ඒ. පී. ඇම්. සිල්වා,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්.

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය,
315, වොක්ෂෝල් වීදිය,
තැ. පෙ. 569,
කොළඹ 2,
1973 දෙසැම්බර් මස 04 වැනි දින.

### ආදර්ශ අයදුම් පත්‍රය

(අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය)

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව—කෘෂිම සිංචන. නිලධා,3 තනතුර**

1. සම්පූර්ණ නාම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය.)

3. (අ) උපන් දිනය :—
වර්ෂය :———. මාසය :——— දිනය :———.
(ආ) දේශිය ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :—
වර්ෂය :———. මාසය :———. දින :———.

4. ඔබ ශ්‍රී ලංකා රටවැසියෙක්ද? පාරම්පාරික රටවැසියෙක්ද? එසේ නැතහොත් ලියාපදිංචිවූ රටවැසියෙක්ද යන බව සඳහන් කරන්න. (ලියාපදිංචිවූ රටවැසියෙක් නම් සහතිකයේ යොමු අංකය හා දිනය සඳහන් කරන්න.) :————.

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරුගේ :————.
(ආ) පියාගේ :————.
(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
(ඈ) මිශ පාර්ශ්වයේ මී මුත්තාගේ :————.
(ඉල්ලුම්කරු උපන්නේ ශ්‍රී ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුය. ඔහු/ඇ උපන්නේ ශ්‍රී ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
(ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක්ද, වැන්දඹුවක්ද යනබව :———— .

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—
(i) සිංහල :————.
(ii) දෙමළ :————.
(iii) ඉංග්‍රීසි :————.

8. වයස අවු. 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තිය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1 | | | 1 | | |
| 2 | | | 2 | | |

9. ක්‍රීඩා පිළිබඳ ලබා ඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිවයුතු පදවි පිළිබඳ විස්තර :————.

10. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණද? :————.

11. ඔබ යම්කිසි සාපරාධි වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරුවී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

12. අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් :————.
(ලබාගන්නා ලද සියළුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තිය සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න.)

13. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් : ————.
(රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.)

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

සැළකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහල 15 වෙනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

14. විශේෂ සුදුසුකම්.— දැන්වීමෙහි දැක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද? එසේ ඇතොත් දිනයන්ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. (විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇත්දැයි ගැසට් නිවේදනය බලන්න.)

15. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

මෙම අයදුම්පතෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

12–460—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා නාවික හමුදාව

### ශිල්පීය නොවන අංශවලට නාවියන් බඳවා ගැනීම

යාන්ත්‍රිකයින්, ඉන්දන කාර්මිකයින්, පණිවුඩ හුවමාරු කරුවන්, ලිපිකරුවන්, ගබඩා සහකරුවන්, ශිලන්හල් උපස්ථායකයින්, විදුලි කාර්මිකයින්, සූපකයින්, තේවකයින්, තූර්ය වාදකයින්, සහ රියැදුරන්, වශයෙන් ශිල්පීය නොවන අංශවලට නාවියන් බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඇබෑර්තු ඇත.

2. පහත සඳහන් සුදුසුකම් ඇත්තා වූ හා අවශ්‍යතාවයන් සපුරාලන්නා වූ අයැදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

3. (අ) **පොදු කොන්දේසි.**—අයැදුම්කරුවන්—

(i) ලාංකිකයෙකු විය යුතුය.

(ii) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හත්වැනි ප්‍රමාණය සමත්ව සිටිය යුතුය.

(iii) හොඳ චරිතයෙන් යුක්ත විය යුතුය.

(iv) පහත සඳහන් අවම ශාරීරික අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය :—

(අ) **උස :** අඩි 5 යි අඟල් 4 යි.

(ආ) **බර :** රාත්තල් 105 යි.

(ඇ) **පපුව :** අඟල් 32 යි (හුස්ම නාල්ලා)

(v) **වයස් සීමාව.**—1974 ජනවාරි 22 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 21 ට නොවැඩි විය යුතුය.

(vi) සෞඛ්‍ය තත්වය නාවික හමුදාධිපති විසින් නියමිත පරිදි වේ.

(ආ) **විශේෂ කොන්දේසි.**—පහත දක්වා ඇති අංශයන් සඳහා ඉල්ලුම් කරන්නා වූ අයදුම්කරුවන්ට ඉහත 3(අ) ඡේදයේ සඳහන් පොදු කොන්දේසිවලට අමතරව පහත සඳහන් සුදුසුකම් ඇතොත් ඔවුන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ :—

| | |
|---|---|
| ඉන්දන කාර්මික<br>විදුලි කාර්මික | (i) කාර්මික විද්‍යාලයන්හි හා වෘත්තීය පාසැල්වලින් ලද පුහුණුව හෝ පිළිගත් කාර්මික වෙළඳ සමාගම්වලින් ලද ආධුනිකත්වය,<br>(ii) අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය) විභාගයෙන් ගණිතය සමත් වී තිබීම. |
| පණිවුඩ හුවමාරුකරු | ඉංග්‍රීසි භාෂාව කියවීමට සහ ලිවීමට හැකියාවක් තිබීම. |
| ලිපිකරු ගබඩා සහකරු | (i) යතුරු ලියනය, ලඝු ලේඛනය, පොත් තැබීම, ගණන් තැබීම සම්බන්ධ දැනීම/පළපුරුද්ද,<br>(ii) අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය) විභාගයෙන් වාණිජ විෂයයන් හා ඉංග්‍රීසි භාෂාව සමත් වී තිබීම. |
| ශිලන්හල්<br>උපස්ථායකයින් | (i) අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය සමත් වී තිබීම.<br>(ii) බෙහෙත් ද්‍රව්‍ය මිශ්‍රණය සම්බන්ධ පළපුරුද්ද/ආධුනිකත්වය. |
| සූපකයින් | (i) හෝටල් පාසැලෙහි ලද පුහුණුව,<br>(ii) පෙර සහ/හෝ අපරදිග සූප ශාස්ත්‍රය පිළිබඳ පළපුරුද්ද. |
| තේවකයින් | (i) හෝටල් පාසැලෙහි ලද පුහුණුව,<br>(ii) ආවතේවකගේ, වේටර ගේ, බීම හල්කරුගේ රාජකාරීන් පිළිබඳ පළපුරුද්ද. |
| රියැදුරන් | බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකයක් තිබීම. |
| තූර්ය වාදකයින් | (i) කුමන හෝ තූර්ය වාදක භාණ්ඩයක් වාදනය කිරීමේ හැකියාව, (පෙර හෝ අපරදිග) ගායනය,<br>(ii) ක්ලැරිනට්ටය, සැක්සොෆෝනය, ට්‍රොම්බෝනය, ෆ්ලූටය (අපරදිග) පියානෝව, ගිටාරය හෝ උඩරට බෙරය දක්ෂ අන්දමින් වාදනය කිරීම. |

**සැලකිය යුතුයි.**—අදාළ පත්වීමට අවශ්‍ය කාර්මික හෝ විශේෂ දැනීමක් යම් අයදුම්කරුවෙකු සතුව ඇතොත් ඔහුගේ වයස් සීමාව අවුරුදු 45 දක්වා වැඩි කිරීමට සහ/හෝ අධ්‍යාපනික සුදුසුකම් වෙනස් කිරීම සලකා බලනු ලැබේ. මෙය විශේෂයෙන් ඉන්දන කාර්මික, විදුලි කාර්මික, තේවක, සූපක සහ රියැදුරු අංශවලට ඉල්ලුම් කරනු ලබන අයැදුම්කරුවන් සඳහා බලපානු ලැබේ.

4. **බඳවා ගැනීමේ ක්‍රමය.**—සමත් වූ අපේක්ෂකයින් බඳවා ගැනීමේදී අංශවලට පත් කරනු ලැබේ. ඒ ඒ අංශවල ස්ථිරත්වය ආධුනික අභ්‍යාස පාඨමාලාවේ දී ඔවුන් විසින් හුවා දක්වන්නා වූ හැකියාවන් මත රඳා පවතී. එම පාඨමාලාව අවසානයේ දී තෝරා ගන්නා ලද අපේක්ෂකයින් අංශ අතර මාරු කිරීම හෝ සේවයෙන් පහ කිරීම නාවික හමුදාධිපතිගේ අභිමතය පරිදි සිදු විය හැක.

5. **සේවා කොන්දේසි.**—බඳවා ගනු ලබන දින වලංගුවන සහ ඉන්පසු වරින්වර සංශෝධනය කරනු ලබන 1950 දෙසැම්බර් 9 දින අංක 10,187 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1950 නාවිකයින් බඳවා ගැනීමේ සහ සේවා රෙගුලාසි අනුව සේවා කොන්දේසි පාලනය වේ.

6. **බඳවා ගැනීමේ කාල සීමාව.**—(අ) සමත් වූ අපේක්ෂකයකු පළමුවෙන් අවුරුදු 5 ක කාලයක් සඳහා බඳවා ගනු ලැබේ. මෙම කාල සීමාව තුල ඔහුගේ සේවය සතුටුදායක වී නම්, පිළිවෙලින් තවත් අවුරුදු 7 ක් සහ 10 ක් සේවය දීර්ඝ කරනු ලැබේ. සාමාන්‍යයෙන් ඔහු අවුරුදු 22 ක කාල සීමාවක් සඳහා සේවය කරනු ලබන අතර, ඉන් අවසානයේ දී ඔහු අර්ථසාධක අරමුදල් සහනයන්ට හිමිකරුවකු වෙනවා ඇත.

(ආ) පටහැනිව කුමක් වුවද, නාවියෙකු වයස අවුරුදු 55 පිරීමෙන් සෑම බඳවා ගැනීමක් හෝ නැවත බඳවා ගැනීමක් නිම වේ.

7. (අ) **වැටුප් හා දීමනා ප්‍රමාණය.**—නාවියෙකුගේ ස්ථිර තරාතිරම අනුව අදාල වන ඒකාබද්ධ වැටුප් ප්‍රමාණයන් පහත පරිදි වේ :—

| | |
|---|---|
| ආධුනික | ... රු. 2,700 වාර්ෂිකව |
| සාමාන්‍ය නාවි | ... රු. 2,880—15×60—රු. 3,780 |
| බල නාවි | ... රු. 3,060—15×60—රු. 3,960 |
| නායක නාවි | ... රු. 3,660—15×72—රු. 4,740 |
| සුළු නිලධාරි | ... රු. 4,620—10×90—රු. 5,520 |
| ප්‍රධාන සුළු නිලධාරි | ... රු. 5,010—10×90—රු. 5,910 |
| පාලක ප්‍රධාන සුළු නිලධාරි | ... රු. 5,640—10×144—රු. 7,080 |

(ආ) විශේෂඥයන් වශයෙන් නාවික හමුදාවෙන් පුහුණු කරනු ලබන නාවියන් මීට වඩා සුළු වැටුප් වැඩි ප්‍රමාණයකට හිමිකම් ලබනු ඇත.

(ඇ) විවාහක නාවියෙකුට රාජ්‍ය සේවා කොන්දේසි අනුව ඔහුගේ තරාතිරමට අදාල වන පරිදි විවාහක දීමනාවක් ගෙවනු ලැබේ. අතිකුත් දීමනා 1972 නාවික වැටුප් සංග්‍රහය අනුව ගෙවනු ලැබේ.

8. බඳවා ගැනීම සඳහා එවනු ලබන ඉල්ලුම්පත් සම්බන්ධයෙන් පහත සඳහන් ව්‍යවස්ථා අදාළ වේ :—

(අ) මෙම නිවේදනය අවසානයෙහි දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව ඉල්ලුම්පත් සකස් කළ යුතුය ;

(ආ) ඉල්ලුම් පත් නාවික හමුදාධිපති, නාවික හමුදා මූලස්ථානය, තැ. පෙ. 593, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුය. ඒවා බහා එවන ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ "බඳවා ගැනීම—නාවියන්" යනුවෙන් සටහන් කළ යුතු අතර 1974 ජනවාරි 22 වැනි දින දහවල් 12 ට පෙර නාවික හමුදා මූලස්ථානයට එවිය යුතුය ;

(ඇ) රජයේ සේවකයින් විසින් එවනු ලබන ඉල්ලුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු අතර තෝරා ගතහොත් නිදහස් කරන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් ලබාගත් ලිපියක් ද ඒ සමග එවිය යුතුය ;

(ඈ) ඉල්ලුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි එවිය යුතුය :—

(i) අයදුම්කරුගේ චරිතය සහ බඳවා ගැනීමට ඇති යෝග්‍යතාවය පිළිබඳ ප්‍රදේශයේ ග්‍රාම සේවකගෙන් ලබාගත් සහතිකයක් ;

(ii) ග්‍රාම සේවක විසින් පිටුපස සහතික කරන ලද අයැදුම්කරුගේ ඉකුත් උපන් දිනට හෝ ඊට පසුව ලබාගත් ඡායාරූපයක් ;

(iii) අයැදුම්පත ලද බව දන්වා එවීම සඳහා තමන්ගේ ලිපිනය ලියන ලද ලියුම් කවරයක්.

9. **රාජ්‍ය භාෂාව.**—ස්ථිර නාවික බල බඳවා, ගනු ලැබූ තෝරාගත් අපේක්ෂකයින් 1956 වර්ෂයේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ද බඳවා ගනු ලබන කල හෝ ඉන් පසු කලින් කල එම පනතට අදළ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු පිණිස පැනවිය හැකි සියළු ව්‍යවස්ථා නියෝග හෝ උපදෙස් අනුගමනය කරන බවට ලියවිල්ලකින් බැඳිය යුතුය.

10. මෙම ඇබෑර්තු සඳහා සැලකිල්ලක් අපේක්ෂා කරන සේවා මුක්ත භටයෙක් වේ නම්, ඉහත සඳහන් පොදු කොන්දේසිවලට අමතරව පහත සඳහන් දෑ ඔප්පු කළ යුතුය :—

(අ) ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්හි, බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලීය සන්නද්ධ හමුදාවන්හි හා ලංකා ආරක්ෂක හමුදාවන්හි වර්ෂයකට නොඅඩු සේවා කාලයක් තිබූ බවට ;

(ආ) සන්නද්ධ සේවාවන්ගෙන් මුදා හැරීමේ දී හෝ අස් කිරීමේ දී ඔහුගේ චරිතය "ඉතා හොඳ" යන්නට වඩා පහළට වර්ග කර නොතිබූ බව ;

(ඇ) සම්පූර්ණ සක්‍රිය සේවා කාලය නිවැරදිව අවුරුදු, මාස සහ දින ගණනින්.

11. අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවන අවස්ථාවේ දී පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය හෝ (උපත ලියාපදිංචි නොකරනු ලැබූ අයදුම්කරුවන් වෙනුවෙන්) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද විශේෂ වයස් සහතිකය ;

සැ. යු.—වයස සනාථ කිරීම වස් බෞතීස්ම සහතික, උපකෘපා පාඨශාලා ව්‍යවස්ථා සඳහා නිකුත් කෙරෙන උප්පැන්න සහතික, සඳහන් ආදිය පිළිගනු නොලැබේ.

(ආ) **අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික.**—පාසල හැර යෑමේ සහතිකය (හෝ අයැදුම්කරු තවමත් පාසැලේ ශිෂ්‍යයෙකු නම් පාසැලේ ප්‍රධානාචාර්යවරයාගෙන් ලබාගන්නා ලද ලිපියක්) සහ සමත් කරන ලද සෑම රජයේ විභාගයක් සඳහා හෝ එවැනි විභාගයක දී සමත් වූ විෂයයන් සඳහා නිකුත් කරන ලද සහතික ;

(ඇ) ග්‍රාමසේවක විසින් නිකුත් කරනු ලැබූ සහතිකය හැර අයැදුම්කරුගේ චරිතය සහ බඳවා ගැනීමට ඇති යෝග්‍යතාවය පිළිබඳව ලබාගන්නා ලද චරිත සහතික තුනක්. අයදුම්කරු රක්ෂාවක නියුක්ත වේ නම් ඉන් එකක් තම වර්තමාන ස්වාමියාගේ නිර්දේශයක් විය යුතුය.

12. තැපෑලේ දී නැතිවුණ, ප්‍රමාද වන ඉල්ලුම්පත් පිළිබඳව කෙරෙන චෝදනාවන් ගැන සලකා බලනු නොලැබේ. පමා වී ඉල්ලුම් පත් එවන අපේක්ෂකයින් විසින් පමාවීමේ ප්‍රතිඵල විඳිය යුතුය.

13. තම ලිපිනය ලියන ලද ලියුම් කවරයක් එවා තිබුණොත් පමණක් ඉල්ලුම් පත ලද බව දන්වා එවනු ලැබේ.

14. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් එවනු ලබන ඉල්ලුම් පත්‍ර ඒවා භාර ගන්නා අවසාන දිනට පසුව මෙම කාර්යාලයට ලැබුණේ නම්, භාර ගන්නා අවසාන දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබී ඔහු විසින් ප්‍රමාදය පිළිබඳ පිළිගත හැකි කරුණු සහිතව ඉදිරිපත් කළ හොත් පමණක් භාරගනු ලැබේ.

15. සුදුසු සේ සැලකෙන අයැදුම්කරුවන් මූලික සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. (එක් අංශයකට වඩා ඉල්ලුම් කර ඇති අයැදුම්කරුවන් එක් මූලික සම්මුඛ පරීක්ෂණයකට වඩා කැඳවීමට ඉඩ ඇත.) ඔවුන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ මෙම නිවේදනයේ 3 (අ) ඡේදයේ පොදු කොන්දේසි (1)-(5) අනුව සුදුසුකම් ලබා ඇතොත් පමණි. තවදුර පරීක්ෂණ සඳහා තෝරා ගනු ලබන අයැදුම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණ එකකට හෝ කිහිපයකට පෙනී සිටීමට සිදු වෙනවා ඇත. අවසාන තෝරා ගැනීමේ මණ්ඩලයකින් පසුව පමණක් අවසාන තෝරා ගැනීම සිදු කෙරේ.

**සැ. යු.**—සම්මුඛ පරීක්ෂණ හෝ වෛද්‍ය පරීක්ෂණ සඳහා පැමිණීමට ගමන් ගාස්තු හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

16. තම දෙමාපියන්ගේ හෝ නීත්‍යානුකූල භාරකාරයාගේ කැමැත්ත පළකොට ලිපියක් පළමුව ඉදිරිපත් නොකළහොත් අයැදුම්කරුවෙකු බඳවා ගනු නොලැබේ. එම කැමැත්ත පළ කෙරෙන ලිපිය තම ප්‍රදේශයේ ග්‍රාම සේවක විසින් සහතික කරවා ගැනීම අවශ්‍ය වේ.

17. ඉල්ලුම්කරුවෙකු නිර්දේශ කිරීමට කැමති කෙනෙක් වේ නම් ඔහු විසින් ඉල්ලුම්කරුට සහතිකයක් දිය යුතුය. ඉල්ලුම්කරුවෙකුගේ තෝරා ගැනීම පිළිබඳව යම්කිසි පෙළඹවීමක් හෝ බලපෑවැත්වීමක් සඳහා ප්‍රයත්නයක් ඇති වුයෙහි නම් ඉල්ලුම්කරු ඒ තනතුර සඳහා නුසුදුස්සෙකු වීමට ඉඩ ඇත.

18. යම් ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව ඔහු තෝරා ගැනීමට පෙර සොයා ගත්තේ නම් ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සෙකු බවට පත් කිරීමටත්, බඳවා ගැනීමට පසුව අනාවරණය වුණි නම් විනයානුකූලව ක්‍රියා කිරීමට සහ නාවික හමුදාවෙන් පහ කිරීමටත් ඉඩ තිබේ.

ඩී. බී. ගුණසේකර,
කොමදෝරු,
නාවික හමුදාධිපති.

1973 නොවැම්බර් මස 29 දින,
කොළඹ දී ය.

## ඉල්ලුම් පත්‍රය

නැවියන් සඳහා ඇබෑර්තු—ශ්‍රී ලංකා නාවික හමුදාව

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ඉල්ලුම් කරන ලද අංශය (ප්‍රමුඛත්වය මත) :—

 (අ) :————.

 (ආ) :————.

 (ඇ) :————.

3. ලිපිනය (තැපැල් කාර්යාලය ඇතුළුව) :————.

4. පළාත :————.

5. ඡන්ද කොට්ඨාශය :————.

6. උපන් දිනය :————.

7. 74. 01. 22 වැනි දිනට වයස :————.

8. සමත් වූ විෂයයන් සහ දිනයන් සමග අධ්‍යාපනික සුදුසුකම් :————.

9. විභාගය සමත් වූ මාධ්‍යය :————.

10. ඉල්ලුම් කර ඇති සෑම අංශයක් සඳහා 3 (ආ) ඡේදය අනුව අයැදුම්කරුට ඇති විශේෂ සුදුසුකම් :—

 (අ) :————.

 (ආ) :————.

 (ඇ) :————.

11. වෙනත් සුදුසුකම් :————.

12. ක්‍රීඩාවලින් ලත් ජය :————.

13. පාසැලෙන් අස්වීමෙන් පසු රැකියාව (සම්පූර්ණ විස්තර සපයන්න) :————.

14. දැනට රැකියාව :————.

15. උස : අඩි :——, අඟල් :——.

 බර : රාත්තල් :————.

 පපුව : අඟල් :——.

16. ජාතිය :————.

17. කිට්ටුම පොලිස් ස්ථානය :————.

18. මීට ප්‍රථම නාවික, යුද්ධ, ගුවන් හා ස්වේච්ඡා සේවාවන්හි සේවය කර ඇතොත් දිනයන් සහ දැරූ තනතුරු පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

19. මුදාහැරීමේ දී/අස් කිරීමේ දී හැසිරීම :————.

20. අදාළ වෙනත් විස්තර :————.

21. සහතික පත්‍රය ලබාගත් ග්‍රාම සේවකගේ නම :————.

ඉහත සඳහන් විස්තර මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-305—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා යුද හමුදව—සෙසු නිල පත්වීම්

1. ශ්‍රී ලංකා යුද හමුද නිත්‍ය බල සේනාවේ ඉඳුරාම බඳවා ගන්නා සෙබලුන් උදෙසා ඇති ඇබෑර්තුවලට මෙහි පහත එක් එක් තනතුර සඳහා පෙන්වා ඇති සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ:—

| පත්වීම | ඒකකය | අවශ්‍ය විශේෂ සුදුසුකම් |
|---|---|---|
| (අ) සාමාන්‍ය සෙබල (වාහන ශිල්පී) ... | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු | අයදුම්කරුවන්ට පිළිගත හැකි ගරාජයක හෝ ආයතනයක මෝටර් රථ අළුත්වැඩියා කිරීම පිළිබඳ අවුරුදු 03ක පළපුරුද්දක් තිබිය යුතුය. ඩීසල් එන්ජින් අළුත්වැඩියා කිරීම ගැන නිපුණත්වයක් ඇති සාමාන්‍ය විද්‍යාව සහ ගණිතය ඉගෙනුම ලැබූ අයවලුන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.<br>**අඩුම අධ්‍යාපන සුදුසුකම.**—සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨය හෝ 8 වෙනි ශ්‍රේණිය හෝ ඒ හා සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය. උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (ආ) සාමාන්‍ය සෙබල (යුක්පම උපකරණ කාර්මික) ... | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු | අයදුම්කරුවන්ට පිළිගත හැකි ආයතනයක දෘෂ්‍යී සහ විද්‍යුත් උපකරණ ආදි පොදු යුක්පම උපකරණ අළුත්වැඩියා කිරීම සහ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් අවුරුදු 03ක පළපුරුද්දක් තිබිය යුතුය. සාමාන්‍ය විද්‍යාව සහ ගණිතයෙන් සාමාර්ථය ලත් අය විශේෂයෙන් සලකනු ලැබේ.<br>**අඩුම අධ්‍යාපන සුදුසුකම්.**—සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨය හෝ 8 වෙනි ශ්‍රේණිය හෝ ඒ හා සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය. උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (ඇ) සාමාන්‍ය සෙබල (යතුරු ලියන කාර්මික) ... | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු | අයදුම්කරුවන්ට පිළිගත හැකි ආයතනයක ඉංග්‍රීසි සහ සිංහල යතුරු ලියන යන්ත්‍ර අළුත්වැඩියා කිරීම පිළිබඳ අවුරුදු 03ක පළපුරුද්දක් තිබිය යුතුය. සාමාන්‍ය විද්‍යාව සහ ගණිතයෙන් සාමාර්ථය ලත් අය කෙරෙහි විශේෂ සැලකිලි දක්වනු ලැබේ.<br>**අඩුම අධ්‍යාපන සුදුසුකම්.**—සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨය හෝ 8 වෙනි ශ්‍රේණිය හෝ ඒ හා සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය. උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (ඈ) සාමාන්‍ය සෙබල (අවිගාරක) ... | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු | අයදුම්කරුවන්ට පොදු අවි අළුත්වැඩියා කිරීම සම්බන්ධව හොඳ දැනීමක් තිබිය යුතු අතර, පිළිගත් ආයතනයක වැඩ පුහුණුවීමේ පාඨමාලාවක් හදරා තිබිය යුතුය. සාමාන්‍ය විද්‍යාව සහ ගණිතයෙන් සාමාර්ථය ලත් අයට විශේෂයෙන් සලකනු ලැබේ.<br>**අඩුම අධ්‍යාපන සුදුසුකම්.**—සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨය හෝ 8 වෙනි ශ්‍රේණිය හෝ ඒ හා සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය. උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (ඉ) සාමාන්‍ය සෙබල (විදුලි කාර්මික) ... | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු | අයදුම්කරුවන්ට අඩු වශයෙන් වාහන විදුලි ශිල්පය ගැන අවුරුදු 03ක් පිළිගත් ගරාජයක හෝ ආයතනයක වැඩ කොට පළපුරුද්ද තිබිය යුතුය. විදුලි ජනකයන් ගැන දැනීම සහ සාමාන්‍ය විද්‍යාව සහ ගණිතයෙන් සාමාර්ථය ලත් අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.<br>**අඩුම අධ්‍යාපන සුදුසුකම්.**—සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨය හෝ 8 වෙනි ශ්‍රේණිය හෝ ඒ හා සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය. උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (ඊ) සාමාන්‍ය සෙබල (පින්තාරුකරු) ... | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු | අයදුම්කරුවන්ට අඩු වශයෙන් මෙම වෘත්තියෙහි අවුරුදු 03ක පළපුරුද්දක් තිබිය යුතුය. ඉසින (ස්ප්‍රේ) පින්තාරු ක්‍රමය හා අකුරු ලිවීම ගැන හොඳ දැනුමක් තිබිය යුතුය.<br>**අඩුම අධ්‍යාපන සුදුසුකම්** —සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨය හෝ 8 වෙනි ශ්‍රේණිය හෝ ඒ හා සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය. උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (උ) සාමාන්‍ය සෙබල (ලෝහ තහඩු කම්කරු/ පෑස්සුම්කරු) ... | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු | අයදුම්කරුවන්ට පිළිගත හැකි ගරාජයක හෝ ආයතනයක අඩු වශයෙන් අවුරුදු 03ක වෘත්තියයෙහි පළපුරුද්ද තිබිය යුතු අතර විද්‍යුත් චාප පෑස්සීම කිරීමටද (ඉලෙක්ට්‍රික් ආර්ක් වෙල්ඩිං) හැකියාවක් තිබිය යුතුය. කම්මල්කරු වෘත්තිය ගැන ඇති දැනුම වැඩිමනත් සුදුසුකම් වේ.<br>**අඩුම අධ්‍යාපන සුදුසුකම්** —සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨය හෝ 8 වෙනි ශ්‍රේණිය හෝ ඒ හා සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය. උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (ඌ) සාමාන්‍ය සෙබල (රිය පෙට්ටි සැකසුම්කරු) ... | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු | අයදුම්කරුවන්ට සියලුම වර්ගවලට අයත් ''අප්හොල්ස්ටරි'' වැඩ හා කැන්වස් යොද කරන වැඩ ගැන අඩු වශයෙන් අවුරුදු 03ක පළපුරුද්දක් තිබිය යුතුය.<br>**අඩුම අධ්‍යාපන සුදුසුකම්.**—සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨය හෝ 8 වෙනි ශ්‍රේණිය හෝ ඒ හා සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය. උසස් අධ්‍යාපන සුදුසුකම ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (එ) සාමාන්‍ය සෙබල (ශිතකරණ කාර්මික) ... | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු | අයදුම්කරුවන්ට පිළිගත හැකි ආයතනයක ශිතකරණ යන්ත්‍ර හා උපකරණ අළුත්වැඩියා කිරීම පිළිබඳව අවුරුදු 03ක පළපුරුද්ද තිබිය යුතුය.<br>**අඩුම අධ්‍යාපන සුදුසුකම්.**—සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨය හෝ 8 වෙනි ශ්‍රේණිය හෝ ඒ හා සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය. උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| (ඒ) සාමාන්‍ය සෙබල (පොදු වැද්දුම්කරු) ... | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු | අයදුම්කරුවන් පිළිගත් ආයතනයක ටෙට වෘත්තිය සම්බන්ධව අවුරුදු 03ක පළපුරුද්දක් සහ වැඩ පුහුණුවීමේ පාඨමාලාවක්ද හදරා තිබිය යුතුය. සාමාන්‍ය විද්‍යාව සහ ගණිතයෙන් සාමාර්ථය ලත් අය විශේෂයෙන් සලකනු ලැබේ.<br>**අඩුම අධ්‍යාපන සුදුසුකම්.**—සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨය හෝ 8 වෙනි ශ්‍රේණිය හෝ ඒ හා සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය. උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |

| පත්වීම | ඒකකය | අවශ්‍ය විශේෂ සුදුසුකම |
|---|---|---|
| (ඛ) සාමාන්‍ය සෙබල (කම්මල්කරු) ... | ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු | අයදුම්කරුවන්ට පිළිගත් ආයතනයක යකඩ ගිනියම් කිරීමෙ සහ පණ පෙවීමේ මනා දැනුමක් ඇතුළුව කම්මල්කරු වෘත්තියේ අවුරුදු 03ක පළපුරුද්දක් තිබිය යුතුය. රේඩියේටර් සහ විවිධ වැඩපල උපකරණ අළුත්වැඩියා කිරීම් සම්බන්ධ හැකියාවක් ඇති අයවලුන් හට එය අමතර සුදුසුකමක් සේ ගණන් ගනු ලැබේ. සාමාන්‍ය විද්‍යාව සහ ගණිතයෙන් සාමාර්ථය ලත් අයට විශේෂයෙන් සලකනු ලැබේ.<br><br>අඩුම අධ්‍යාපන සුදුසුකම්.—සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨය හෝ 8 වෙනි ශ්‍රේණිය හෝ ඒ හා සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය. උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |

2. හුරුකම් හා කායශක්ෂමතාවය දැනගැනීම සඳහා තෝරාගැනීමට ප්‍රථම අයදුම්කරුවන් තමන්ට අයත් වෘත්තියෙහි වෘත්තීය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

3. ඉහත දැක්වෙන 1 වෙනි ඡෙදයේහි සඳහන් විශේෂ සුදුසුකම් නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් සලකා බලනු නොලැබේ. එහෙත් ශ්‍රී ලංකා යුද හමුදාවේ ස්වේච්ඡා බල සේනාවට අයත් අය සම්බන්ධයෙන් වන විට, අවුරුදු තුනක ප්‍රායෝගික පළපුරුද්ද එක් අවුරුද්ද දක්වා අඩු කළ හැකිය.

4. ඉහත 1 වෙනි ඡෙදයෙහි දක්වා ඇති විශේෂ සුදුසුකම්වලට අමතර වශයෙන්, ශ්‍රී ලංකා යුද හමුදාවට ඉදුරාම බැඳෙන සෙබලෙකු ලෙස බැඳීම සඳහා පහත සඳහන් සාමාන්‍ය කොන්දේසිද සපුරාලිය යුතුය :—

අයදුම්කරුවන්—

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු වේ.

(ආ) 1974 ජනවාරි මස 15 වෙනි දිනට වයස අවුරුදු 18ට නොඅඩුවද වයස අවුරුදු 30ට නොවැඩිවද සිටිය යුතුය.

(ඇ) ශ්‍රී ලංකා යුද හමුදාධිපතිගේ සතුටට හේතුවනාකාර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු වේ.

(ඈ) උස අඩි 5යි අඟල් 4ට අඩු නොවිය යුතුයි. කෙසේ වෙතත් යුද හමුදාධිපතිගේ අනුමැතිය ඇතිව විශේෂ අවස්ථාවන්හිදී උස අඩි 5යි අඟල් 4ට අඩු අයද බඳවාගත හැක.

(ඉ) රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රවීණතාවය පැහැදිළිව දැක්විය යුතු වන අතර එය සනාථ කළ යුතු වේ.

5. සේවා කාලය.—සාමාන්‍ය වශයෙන් අවුරුදු 12ක සේවා කාලය සඳහා බඳවාගනු ලබන සෙබලෙකු පළමු අවුරුදු 5 නිත්‍ය බල සේනාවෙද, ඉතිරි අවුරුදු 7 නිත්‍ය උප සේවා බල හමුදාවෙද සේවය කිරීමෙන් පසු අස් කරනු ලැබීමට ඉඩ තිබේ. සමහර අවස්ථාවලදී සෙබලෙකුට ස්වකීය නිත්‍ය හට හමුදාවේ සේවය අවුරුදු 12 දක්වා දීර්ඝ කරනු ලැබීමටත් ඔහුගේ මුල් බැඳීමේ සිට අවුරුදු 32ක සේවය සඳහා නැවත බැඳීමටත් ඉඩ දෙනු ලැබේ.

6. වැටුප් හා දීමනා ප්‍රමාණයන්.—(අ) III වෙනි ඝණය—1, 2 සහ 3 වෙනි තරුවේ වෘත්තිය නුපුහුණු සහ 'බී' පන්තියේ 1, 2 සහ 3 වෙනි ශ්‍රේණියේ වෘත්තිය පුහුණුවන් ඇතුළත් වේ.

| නිලය | ඒකාබද්ධ වැටුප (අවුරුද්දකට) |
|---|---|
| සාමාන්‍ය සෙබල හෝ සමාන නිලය ... ... | රු. 2,880—15 × 60—රු. 3,780 |
| ලාන්ස් කෝප්‍රල් හෝ සමාන නිලය ... ... | රු. 3,060—15 × 60—රු. 3,960 |
| කෝප්‍රල් හෝ සමාන නිලය ... ... ... | රු. 3,660—15 × 72—රු. 4,740 |
| සැරයන් ... ... ... ... | රු. 4,620—10 × 90—රු. 5,520 |
| මාණ්ඩලික සැරයන් ... ... ... | රු. 5,010—10 × 90—රු. 5,910 |
| බලලත් නිලධාරී—II වෙනි පන්තිය ... ... | රු. 5,220—10 × 120—රු. 6,420 |
| රෙජිමේන්තු උපකරණ පාලක සැරයන් ... ... | රු. 5,340—10 × 120—රු. 6,540 |
| බලලත් නිලධාරී—I වෙනි පන්තිය ... ... | රු. 5,640—10 × 144—රු. 7,080 |

(ආ) II වෙනි ඝණය—වෘත්තිය පුහුණු ' ඒ ' පන්තියේ 1, 2 සහ 3 වෙනි ශ්‍රේණි ඇතුළත් වේ.

| නිලය | ඒකාබද්ධ වැටුප (අවුරුද්දකට) |
|---|---|
| සාමාන්‍ය සෙබල හෝ සමාන නිලය ... ... | රු. 2,940—15 × 60—රු. 3,840 |
| ලාන්ස් කෝප්‍රල් හෝ සමාන නිලය ... ... | රු. 3,120—15 × 60—රු. 4,020 |
| කෝප්‍රල් හෝ සමාන නිලය ... ... ... | රු. 3,720—15 × 72—රු. 4,800 |
| සැරයන් ... ... ... ... | රු. 4,800—10 × 90—රු. 5,700 |
| මාණ්ඩලික සැරයන් ... ... ... | රු. 5,250—10 × 90—රු. 6,150 |
| බලලත් නිලධාරී—II වෙනි පන්තිය ... ... | රු. 5,520—10 × 120—රු. 6,720 |
| රෙජිමේන්තු උපකරණ පාලක සැරයන් ... ... | රු. 5,700—10 × 120—රු. 6,900 |
| බලලත් නිලධාරී—I වෙනි පන්තිය ... ... | රු. 5,940—10 × 144—රු. 7,380 |

(ඇ) I වෙනි ඝණය—" එක්ස් " පන්තියේ වෘත්තිය පුහුණු 1, 2 සහ 3 වෙනි ශ්‍රේණි ඇතුළත් වේ.

| නිලය | ඒකාබද්ධ වැටුප (අවුරුද්දකට) |
|---|---|
| සාමාන්‍ය සෙබල හෝ සමාන නිලය ... ... | රු. 3,000—15 × 60—රු. 3,900 |
| ලාන්ස් කෝප්‍රල් හෝ සමාන නිලය ... ... | රු. 3,240—15 × 60—රු. 4,140 |
| කෝප්‍රල් හෝ සමාන නිලය ... ... ... | රු. 3,840—15 × 72—රු. 4,920 |
| සැරයන් ... ... ... ... | රු. 4,920—10 × 90—රු. 5,820 |
| මාණ්ඩලික සැරයන් ... ... ... | රු. 5,340—10 × 90—රු. 6,240 |
| බලලත් නිලධාරී—II වෙනි පන්තිය ... ... | රු. 5,700—10 × 120—රු. 6,900 |
| රෙජිමේන්තු උපකරණ පාලක සැරයන් ... ... | රු. 5,880—10 × 120—රු. 7,080 |
| බලලත් නිලධාරී—I වෙනි පන්තිය ... ... | රු. 6,120—10 × 144—රු. 7,560 |

(ඈ) විවාහක සෙසු නිලයින්ගේ දීමනා.—රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට අදාල පරිදි එම කොන්දේසි හා ඒ අන්දමට විවාහක සෙසු නිලයින් වෙනුවෙන් දීමනාවක් ගෙවනු ලැබේ.

(ඉ) රජක දීමනා.—

(1) නේවාසිකව වෙසෙන සෙබලෙකුගේ නිල ඇඳුම හමුද වියදමෙන් පිරිසිදු කරනු ලැබේ.

(2) හමුද නිවාසයෙන් බැහැරව වෙසෙන සෙබලෙකුට ඔහුගේ නිල ඇඳුම් පිරිසිදු කිරීම පිණිස ශ්‍රී ලංකා යුද හමුදාධිපති විසින් නිගමනය කරනු ලබන දීමනාවකට හිමිකරු වෙනු ඇත.

(ඊ) යහපත් හැසිරීමේ දීමනා.—පහත සඳහන් ක්‍රමය අනුව ගෙවනු ලැබේ.

(1) 1 වෙනි පදක්කම—අවුරුදු 4ක යෝග්‍යතා සේවයෙන් පසු දිනකට ශත 25 යි
(2) 2 වෙනි පදක්කම—අවුරුදු 8ක යෝග්‍යතා සේවයෙන් පසු දිනකට ශත 50 යි
(3) 3 වෙනි පදක්කම—අවුරුදු 12ක යෝග්‍යතා සේවයෙන් පසු දිනකට ශත 75 යි

(උ) දුෂ්කර පළාත්වල සේවය කරන සෙසු නිලයින් සඳහා දීමනා.—
(1) නිවිතිගල රාජකාරි මන්නාරම සහ යාපනය යන පෙදෙස්වල.
(2) වලවේ, පදවිය සහ මුතියම්කච්චිකුලම්වල පිහිටි ගොවි ජනපදවල
(3) ශ්‍රී ලංකා යුද හමුදාධිපති විසින් විධානය කරනු ලබන ඉංජිනේරු යෝජනාක්‍රමවල සේවය කරන සෙසු නිලයින් සඳහා ගෙවනු ලැබේ.

(ඌ) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම.—රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සඳහා තම දායක මුදල් වශයෙන් තම ඒකාබද්ධ වැටුපෙන් සියයට හයක මුදලක් අඩුකරගැනීම ගැන තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් ශ්‍රී ලංකා යුද හමුදාවට බැඳීමේදී සෑම සෙබලෙකු විසින්ම දිය යුතුය.

7. මෙම දැන්වීමේ පළමුවෙනි ඡෙදයේ දැක්වෙන ඉදුරාම බඳවාගැනීම පිළිබඳ ඇබෑර්තු සඳහා එවනු ලබන ඉල්ලුම් පත් පහත සඳහන් නීතිවලට අනුකූලව එවිය යුතුය :—

(අ) ඉල්ලුම් පත් මෙම නිවේදනයේ අන්තයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ අනුසාරයෙන් ඉල්ලුම්කරුගේ අත් අකුරින්ම පුරවන ලද ඒවා විය යුතුය.

(ආ) ඉල්ලුම් පත් '' ශ්‍රී ලංකා යුද හමුදා ආධුනිකයින් බඳවන නිලධාරි, ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ '' යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයෙහිද, එය බහාලනු ලබන කවරය මතුපිටද ''ඉල්ලුම් පත්‍ර—නිත්‍ය බල සේනාවේ සාමාන්‍ය සෙබල—ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය '' යනුවෙන් සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත් 1974 ජනවාරි මස 15 වෙනි දින ප.ව. 4.00 පැයට පෙර ඉහත කී ලිපිනයට එවිය යුතුය.

(ඇ) ඉල්ලුම් පත්වලට පහත සඳහන් සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතුය :—

(1) උප්පැන්න සහතිකය හෝ උප්පැන්නය ලියාපදිංචි කර නැති අපේක්ෂකයින් සම්බන්ධයෙන් නම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකය (බව්තීස්ම සහතික, ආධාර ලබන පාසැල්වල රෙගුලාසි සංග්‍රහය යටතේ භාවිතයට පමණක් නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ ජන්ම පත්‍ර භාරගනු නොලැබේ).

(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(3) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකයක්.

(4) ඉල්ලුම්කරුගේ චරිත ශුද්ධිය සහ මෙම තනතුර පිළිබඳ යෝග්‍යතාවය ගැන මෑතකදී ලබාගත් සහතික තුනක්, රක්ෂාවක යෙදී සිටින්නේ නම් මින් එක සහතිකයක් තමාගේ ස්වාමියාගෙන් විය යුතුය.

(5) ක්‍රීඩා, ශිෂ්‍ය භට පිළිබඳ සහතික යනාදිය.

සැලකිය යුතුයි.—

(1) මෙම සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුත්තේ ඉල්ලුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් පමණි.

(2) ඉල්ලුම් පත්‍රය සමග සහතිකවල මුල් පිටපත් එවනු ලැබ ඒවා නැති වුවහොත් ඊට ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානය වග කියනු නොලැබේ.

(ඇ) නැපැලේදී නැතිවන, ප්‍රමාදවන ඉල්ලුම් පත්‍රයක් හෝ ඊට අදාල ලිපියක් පිළිබඳව කෙරෙන චෝදනාවක් ගැන සලකා බලනු නොලැබේ.

(ඉ) සවේච්ඡා හමුදාවල සාමාජිකයින්ගේ ඉල්ලුම් පත් ඔවුන්ගේ ඒකක මූලස්ථානය මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඊ) රජයේ සේවයේ යෙදී සිටින අය විසින් එවනු ලබන ඉල්ලුම් පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(උ) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලැබ, ඉල්ලුම් පත් භාරගන්නා දිනට පසුව මෙම මූලස්ථානයට ලැබෙන ඉල්ලුම් පත්, භාරගන්නා අවසාන දිනට පෙර දෙපාර්තමේන්තුවට ලැබී යථෝක්ත දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ප්‍රමාදය පිළිබඳව පිළිගත හැකි කරුණු සහිතව ඉදිරිපත් නොකරන ලද ඉල්ලුම් පත් භාරගනු නොලැබේ.

(ඌ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා තමාගේම වියදමෙන් පැමිණ පෙනී සිටිය යුතුය. එම ඉල්ලුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණය පවත්වන ස්ථානය, දිනය හා වේලාව පුද්ගලිකව දන්වනු ලැබේ.

(එ) තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගැනීමට සුදුසුයැයි තෝරාගන්නා ලද ඉල්ලුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණ එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා තමාගේම වියදමෙන් කොළඹදී පෙනී සිටිය යුතුය.

(ඒ) සම්මුඛ පරීක්ෂණයෙන් සහ ශ්‍රී ලංකා යුද හමුදා තේරීම් මණ්ඩලය මගින් පවත්වනු ලබන අවශ්‍ය අනිකුත් පරීක්ෂණවලින් පසුව ශ්‍රී ලංකා යුද හමුදා නිත්‍ය භට සේනාවට බඳවාගන්නා අතර ශ්‍රී ලංකා යුද හමුදා අභ්‍යාස මධ්‍යස්ථානයෙහි හෝ අන් තැනෙක පවත්වනු ලබන පුහුණු වීමේ අභ්‍යාස පාඨමාලාවක් අනුගමනය කිරීමට සලසනු ලැබේ.

(ඔ) වයස අවුරුදු 21 ට අඩු අය තමාගේ දෙමව්පියන්ගේ හෝ භාරකාරයන්ගේ කැමැත්ත පළමු කොට ලියවිල්ලකින් ලබාගෙන නොමැති නම් නිත්‍ය භට සේනාවට බඳවාගනු නොලැබේ.

(ඕ) තෝරා පත්කරගත් සෑම ඉල්ලුම්කරුවෙක්ම ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂාපනත ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූල විය යුතුයි.

(ක) ඉල්ලුම්කරු රෙකමදාරු කිරීමට කැමැති කෙනෙකු වේ නම් ඔහු විසින් ඉල්ලුම්කරුට සහතිකයක් දිය යුතුය. ඉල්ලුම්කරුගේ තෝරා ගැනීම පිළිබඳව දරන අයථා ප්‍රයත්නයක් වේ නම් ඉල්ලුම්කරු ඒ තනතුරට නුසුදුසු අයෙකු වීමට ඉඩ තිබේ.

(ග) යම් ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව ඔහු තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුනි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

ඊ. ඩී. ද ඉසැඩ් අබේසේකර,
කර්නල්,
යුද හමුදාධිපති වෙනුවට.

ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානය
තැ. පෙ. 553, කොළඹ.

ශ්‍රී ලංකා යුද හමුදා නිත්‍ය භට සේනාවේ සෙසු නිළ පත්වීම් සඳහා වූ

ආදර්ශ ආකෘති පත්‍රය

| අයදුම්කරු ලියාපදිංචි වී ඇති රාජ්‍ය සභා මැතිවරණ කොට්ඨාශය ........................................ | අයදුම්කරු අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය ........................................ |
|---|---|

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :———— .
2. ලිපිනය :————.
3. උපන් දිනය :————. වයස : අවුරුදු :————, මාස :————.
4. අධ්‍යාපන සුදුසුකම් :————
5. ඉල්ලුම් කරන තනතුර :————.
(මෙම නිවේදනයේ 1 වෙනි ඡෙදයේ දක්වා ඇති පරිදි පත්වීම් සඳහන් කළ යුතුය).
6. මෙම නිවේදනයේ 1 වෙනි ඡෙදයේ දක්වා ඇති පරිදි පත්වීම් සඳහා සුදුසුකම් හා පළපුරුද්ද ඔබට තිබේද ? ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර :———— .
7. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූවාට පසු යෙදී සිටි රක්ෂාව :————.

8. උස : අඩි :————, අඟල් :————.

9. ජාතිය :————.

10. ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.

11. ඉතා කිට්ටු තැපැල්/විදුලි පණිවුඩ කාර්යාලය :————.

12. මීට ප්‍රථම යුද, නාවික, ගුවන් හා ස්වෙච්ඡා සේවක හමුදාවල දරූ තනතුරු ආදියක් වේ නම් තත්ත්වය හා දිනය ඇතුළුව සම්පූර්ණ විස්තර : ——— .

13. වෛද්‍ය පරීක්ෂණයකින් අසමත් වීම නිසා ඔබ ශ්‍රී ලංකා යුද හමුදාවට, ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බඳවා ගැනීම ප්‍රතික්ෂේප කොට තිබේද ? :—— ——.

14. යුද සේවයෙන් අස්වීමේදී හෝ අස්කරනු ලැබීමේදී චරිතය (සේවා මුක්ත භටයෙක් වේ නම් යුද සේවයෙන් අස්වීමේදී, අස්කිරීමේදී ලබා ගත් සහතික පිටපත් ඇමිණිය යුතුයි) :————.

15. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා ආදිය) :————.

16. ඉදිරිපත් කරණ ලද චරිත සහතික ලබා ගත් අයගේ නම් සහ තනතුරු (මෙම නිවේදනයේ 7 ඡේදයේ (ඇ) (4) බලන්න.)

(1) ———.

(2) ———.

(3) ———.

17. ඉල්ලුම්කරු අත්සනින් කර සිටින ප්‍රකාශය : මා විසින් සපයන ලද ඉහත සඳහන් විස්තර මාගේ දැනීමේ හැටියට සත්‍ය බවට මෙයින් සහතික කරමි.

————,

ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

12–374—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා රජයේ වාණිජ (ඒකාබද්ධ අපනයන) නීතිගත සංස්ථාව**

පුරප් පාඩුව—විධායක—නිෂ්පාදන දෙපාර්තමේන්තුව

පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**වයස.**—74.1.1 වන දිනට අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි.

**අධ්‍යාපන සුදුසුකම්.**—අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍යය) විභාගයෙන් විෂයයන් 6 ක සාමාර්ථය. ඉංග්‍රීසි භාෂාව, ශුද්ධ ගණිතය/අංක ගණිතයට සම්මාන විශේෂ සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

පළපුරුද්ද.—දේශීය නිෂ්පාදන අලෙවිය පිළිබඳ වසර 5 කට නොඅඩු පළපුරුද්ද. මේ හා සමාන හෝ විශාල වෙළඳ ආයතනයක ශ්‍රී ලංකා නිෂ්පාදන විශේෂයෙන් විරාගා නොවන නිෂ්පාදන පිළිබඳ ව්‍යාපාරික දැනුමක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප්.**—ජෝර්ජ් රාජපක්ෂ කමිටුවේ නිර්දේශ මත ගනු ලබන තීරණය අනුව සිදුවන වැටුප් වෙනස් කිරීම්වලට යටත්ව මසකට සියල්ල ඇතුළුව රු. 1000—10 × 50—1500.

1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට යෙදීමේදී දනට පනවා ඇති හා මතුවට පනවනු ලබන නීති අනුව, තෝරා ගනු ලබන අයදුම්කරු ක්‍රියා කළ යුතුවේ.

රජයේ දෙපාර්තමේන්තුවල හා රාජ්‍ය සංස්ථාවල සේවය කරන අයදුම්කරුවන් තම ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

තම වයස, අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර සඳහන් කර සහතික පත් පිටපත් සමග අයදුම්පත්, 1971 දෙසැම්බර් මස 28 වන දිනට හෝ ඊට පෙර සභාපති වෙත ලැබෙන සේ 'ලියාපදිංචි තැපෑලෙන්' එවිය යුතුයි. කවරයේ වම්පස ඉහළ 'නිෂ්පාදන විධායක' යන්න සඳහන් කළ යුතුයි.

අයදුම්පත් නිකුත් කරණු නොලැබේ.

සී. ලුඩ්කින්ස්,
සභාපති,
ශ්‍රී ලංකා රජයේ වාණිජ (ඒකාබද්ධ අපනයන)
නීතිගත සංස්ථාව.

තැ. පෙ. 263,
අංක 68/70, යෝර්ක් වීදිය,
කොළඹ 1.

12–383—73.12 .14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**ආයුර්වේද දෙපාර්තමේන්තුව**

ආයුර්වේද මහාරෝගශාලාවේ I ශ්‍රේණියේ වෛද්‍ය අධිකාරී

තනතුර

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, ආයුර්වේද මහාරෝගශාලාවේ, I වැනි ශ්‍රේණියේ අධිකාරී තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ ආකෘති පත්‍රයක් හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1973. 1. 4 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1973. 1. 11 වැනිදා.

**සටහන් :**

(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන්ට තම ඉල්ලුම් පත්‍ර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී බාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ශ්‍රී ලංකා ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවක් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

2. සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි :—

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසර දෙනු නොලැබේ.

(iii) තෝරාගත් අයදුම්කරු පත්වීම ස්ථිර කිරීමට පෙර මුදල් රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ, ආයතන සංග්‍රහය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ආශ්‍රිත ලිඛිත පරීක්ෂණයකින් ද ආරෝග්‍යශාලා පාලනය හා සිංහල/දෙමළ භාෂාව පිළිබඳ නියමිත වාචික පරීක්ෂණයකින් ද සමත්විය යුතුය. මෙම පරීක්ෂණය නම් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සඳහා පැවැත්වෙන පරීක්ෂණයයි.

මෙම පරීක්ෂණය සමත්වීමට අපොහොසත් වුවහොත් ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 9 : 6 වැනි වගන්තියේ අඩංගු රෙගුලාසිවල විධිවිධානයන් අදාල වනු ඇත.

3. **වැටුප් හා දීමනා.**—වර්ෂයකට රු. 14,880 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් සහිතව වර්ෂයකට රු. 11,040—480×10 හා 600×3—රු. 17,640 ක් වූ ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මෙම තනතුරට හිමිය. (වර්ෂයකට රු. 144,880 ට පෙර කාර්යක්ෂමතා කඩඉම වැඩි සහ හැසිරීම පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් දෙනු ලබන සහතිකයකින් සමත් විය යුතු වේ)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1973. 12. 14 දිනට අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි බව. (මෙම උපරිම වයස් සීමාව දෙපාර්තමේන්තු නිලධාරීන් කෙරේ බලපාන්නේ නැත.)

(ඇ) පිළිගත් ආයුර්වේද විද්‍යාලයක ඩිප්ලෝමා සහතිකයක් ලබා ඇති බව.

(ඈ) රජයේ ආයුර්වේද ආරෝග්‍යශාලාවක වෛද්‍යවරයෙකු වශයෙන් අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් ඇති බව.

(ඉ) පශ්චාත් උපාධි සුදුසුකම් හෝ ආයුර්වේදය පිළිබඳ මූලික පර්යේෂණ හෝ නොයෙකුත් ප්‍රකාශන පළකිරීමෙන් ලත් විශිෂ්ඨ කීර්තියක් ලබා ඇති බව.

(ඊ) අවුරුදු 2 කට නොඅඩු පරිපාලන පළපුරුද්දක් ඇති බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකාර පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතික.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැන ගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (11අ) වන පරිච්ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

සී. ඊ. ඇස්. වීරතුංග,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

1973 දෙසැම්බර් මස 3 වැනි දින,
කොළඹ 1, මහලේකම් ගොඩනැගිල්ලේ
සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

අංකය : ..............................................
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

ඉල්ලුම් පත්‍ර පෝරමය

1. ඉල්ලුම් කරන තනතුර :—

තනතුර :————.

දෙපාර්තමේන්තුව :————.

2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දනුම් දිය යුතුය)

4. උපන් දිනය :—

වර්ෂය :——, මාසය :——, දිනය :————.

5. දේශීය ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :—

වර්ෂ :——, මාස :——, දින :————.

6. ඔබ ලංකා රටවැසියෙක්ද ? පාරම්පරික රටවැසියෙක් ද එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (සටහන අංක (1) බලන්න) :————.

7. උපන් ස්ථානය (සටහන අංක (2) බලන්න) :—

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

8. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහකද ? අවිවාහකද ? වැන්දඹුවෙක් ද වැන්දඹු විය ද යන බව :————.

9. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(3) ඉංග්‍රීසි :————.

10. වයස අවුරුදු 12 න් පසු ඉගෙනිම ලැබූ පාඨශාලා සහ වෙනත් ආයතන :————.

(2)

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තිය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| (1) .............................. | ...... | ........ | (1) .......... | .............. | ......... |
| (2) .............................. | ...... | ........ | (2) .......... | .............. | ......... |
| (3) .............................. | ...... | ........ | (3) .......... | .............. | ......... |
| (4) .............................. | ...... | ........ | ...4) .......... | .............. | ...... |

11. ක්‍රීඩා පිළිබඳව ලබා ඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිවයුතු පදවි පිළිබඳ විස්තර :————.

12. (ඒ) ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද ? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණකටද ? :————.

(බී) ඔබ සැපරාධි වරදකට උසාවියකදී චෝදනා ලැබූවෙක් ද ? එසේ නම්, දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

13. අධ්‍යාපන, වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සමර්ථ වෘත්තිය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පංතියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න) :————.

| 14. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂා වල් : | පදවිය | සිට දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| (රක්ෂාවට බැඳුනු දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න) සැලකිය යුතුයි : ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහළ 16 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුය. | (1) ................ | | |
| | (2) ................ | | |
| | (3) ................ | | |
| | (4) ................ | | |
| | (5) ................ | | |
| | (6) ................ | | |
| | (7) ................ | | |
| | (8) ................ | | |

15. විශේෂ සුදුසුකම් (දැන්වීමෙහි දැක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද? එසේ ඇතහොත් දිනයන් ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇත්දැයි ගැසට් නිවේදනය බලන්න) :————.

16. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

17. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගත හොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

සටහන් :

1) ඔබ ලංකාවේ රටවැසියකු ව සිටින්නේ ලියාපදිංචි වීමෙන් නම්, ඔබට නිකුත් කරන ලද රටවැසි සහතිකයේ යොමු අංකය සහ දිනය සඳහන් කරන්න.

2) ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු/ඈ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඈ) හෝ පිරවිය යුතුයි.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :————.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ පදවි නාමය.

දිනය :————.

12-389—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව

ලිපිකරු තනතුර

ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාවේ ලිපිකරු තනතුරු සඳහා අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම් පත අනුව සකස් කළ අයදුම් පත් "ලිපිකරු තනතුර" යනුවෙන් කවරයේ උඩ වම් කෙළවරේ සටහන් කර, 1973 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

(1) **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—අවුරුදු 3ක පරිවාස කාල සීමාවකට යටත්ව, මෙම තනතුරු ස්ථිරය. සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය හිමිය ;

(2) **වැටුප් පරිමාණය.**—රු. 280—10×8, 15×6—රු. 450 (මාසික);

(3) **වයස් සීමාව.**—73.12.31 දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුයි. (රජයේ, සංස්ථා සේවකයින්ට වයස සීමාව බල නොපානු ඇත) ;

(4) **අවශ්‍ය සුදුසුකම්.**—(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ දෙවරකට නොවැඩි වාර ගණනකින් සිංහල, අංක ගණිතය/ගණිතය ඇතුළු විෂයයන් හයකින් සාමාර්ථ ලත් අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය (සාමාන්‍ය පෙළ) හා පිළිගත් ආයතනයක ලිපිකරුවෙකු වශයෙන් අවුරුදු 5ක පළපුරුද්ද ;

හෝ

(ii) ඉහත 1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් (උසස් පෙළ) අඩු වශයෙන් විෂයයන් 2ක් සමත්වීම හා පිළිගත් ආයතනයක ලිපිකරුවෙකු වශයෙන් අවුරුදු 2ක පළපුරුද්ද.

රජයේ හෝ සංස්ථා සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම් පත් තමන්ගේ දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

සභාපති.

1973 නොවැම්බර් 30,
ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව,
207/3, ධර්මපාල මාවත, කොළඹ 7.

(ආදර්ශ අයදුම් පත)

ලිපිකරු තනතුර සඳහා අයදුම් පත්‍රයයි

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා වයස :————.
4. විවාහක/අවිවාහක බව :————.
5. (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන්, විභාග වර්ෂය සහිතව සමත් වූ විෂයයන් :—
   (1) :————.
   (2) :————.
   (3) :————.
   (4) :————.
   (5) :————.
   (6) :————.
   (7) :————.
   (8) :————.

   (ii) උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යාපන පොදු සහතික (උසස් පෙළ) විභාගයෙන් සමත් වූ විෂයයන් :—
   (1) :————.
   (2) :————.
   (3) :————.
   (4) :————.
6. **ලබා ඇති පළපුරුද්ද.**—(ආයතනයේ නම, ලිපිනය, කාල සීමාව ආදී විස්තර මෙහි සඳහන් කර සහතික පිටපත් අමුණන්න)
7. වෙනත් සුදුසුකම් :————.
8. චරිත සහතික ලබාගෙන ඉදිරිපත් කරන දෙදෙනෙකුගේ නම හා ලිපිනය :—
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

මවිසින් සපයා ඇති ඉහත සඳහන් කරුණු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-450—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

## තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### ආධුනික සැලසුම්කරු තනතුරු

තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ආධුනික සැලසුම්කරු තනතුරුවල පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කර 1973. 12. 31 දිනට පෙර, කොළඹ 1, ලෝටස් පාරේ, තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානයේ, 5 වන මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරුගේ ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(2) **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අදාල ඒකාබද්ධ වැටුප් ක්‍රමය වර්ෂයකට රුපියල් 3,000—1×90—රු. 3,000 කි. (මෙය 1969. 10. 01 දිනට පෙර පැවති වර්ෂයකට රු. 960—1×72—රු. 1,032 යන කල්පිත වැටුප් ක්‍රමයට සමාන වේ.)

(3) **බඳවා ගැනීමේ ක්‍රමය.**— තෝරා ගැනීමේ කාර්යය සඳහා සැදුම් ලත් තෝරීමේ මණ්ඩලයක් මගින් සුදුසුකම් ලත් අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

(4) **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :—**

(අ) මෙම තනතුරු තාවකාලිකය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) තෝරා ගනු ලබන අපේක්ෂකයන් දෙපාර්තමේන්තුවේ දෙවර්ෂයක ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතුය.

(ඇ) ප්‍රායෝගික පුහුණුව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් සහ නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණයන් ගෙන් සමත් වීමෙන් පසුව, අපේක්ෂකයන් II පෙළ සැලසුම්කරුවන් වශයෙන් ස්ථිර තනතුරු වලට පත් කරනු ලැබීමට සුදුස්සන් වෙනු ඇත.

(ඈ) පත් කරනු ලබන අපේක්ෂකයන් කාර්යාල ඇතුලත මෙන්ම එළිමහනේද රාජකාරි කිරීමට නියම කරනු ඇත.

(ඉ) පත් කරනු ලබන අපේක්ෂකයන් සිය ප්‍රායෝගික පුහුණුව අවංකව හා අභලස්ව හදාරා දෙවන පෙළ සැලසුම් කරුවන් ලෙස සුදුසුකම් ලබා ගැනීමටත් ප්‍රායෝගික පුහුණුව අවසන් කිරීමෙන් පසුව, නියම කරනු ලැබුවහොත්, පස් වර්ෂයකට නොඅඩු කාලසීමාවක් II පෙළ සැලසුම්කරුවෙකු වශයෙන් රජය යටතේ සේවය කිරීමට ගිවිසුමකට ඇතුළත් විය යුතුය. මෙම කොන්දේසි හරියාකාරව පිළිපැදීම සඳහා පුහුණුව ලබන්නා හා ඔහුගේ දෙමාපියන් හෝ භාරකරු, ඇපකරුවන් දෙදෙනෙකු ඇතුළුව රු. 5,000 ක බැඳුම්කරයකට ඇතුළත් විය යුතු ය.

(5) **අවශ්‍ය සුදුසුකම් :—**

(i) සෑම අයැදුම්කරුවෙකුම 1973. 12. 31 වන දිනට වයස අවුරුදු 18 ට නො අඩු විය යුතු අතර. අවුරුදු 24 ට නොවැඩි විය යුතුය.

(ii) (අ) ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ; හෝ

(ආ) ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළත් ව විෂයය හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත් විය යුතු අතර, පහත පෙනෙන සුදුසුකම් වලින් එකක් ද ලබා සිටිය යුතුය.

(ඇ) ආධුනික සැලසුම්කරුවනගේ පාඨ මාලාව හදාරා අවසාන පරීක්ෂණයෙන් සමත්ව සිටිය යුතුය.

හෝ

(ඈ) ගෘහ නිර්මාණ ශිල්පය සන්ධ්‍ය හෝ පූර්ණ කාලීන පාඨ මාලාවේ I, II හා III යන කොටස් අනුගමනය කොට අවසාන පරීක්ෂණයෙන් සමත්ව සිටිය යුතුය.

හෝ

(ඉ) කණිෂ්ඨ කාර්මික නිලධාරින්ගේ ඇවුරුදු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කොට සමත්ව සිටිය යුතුය.

(6) අයැදුම්කරුවන් පහත සඳහන් සහතික වල පිටපත් තම අයැදුම්පත් වලට යාකර එවිය යුතුය :-

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකාන පාසලක ප්‍රයෝජනය සඳහා වූ හෝ බෞතිස්ම සහතික භාර නොගැනේ.)

(ආ) මෑතදී ලබාගත් චරිත සහතික තුනක් (ඉන් එකක් විද්‍යාලයේ හෝ විශ්ව විද්‍යාලයේ ආචාර්යවරයාගෙන් විය යුතුය.)

(ඇ) ලබා ඇති වෘත්තීය හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඈ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(7) රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවන්හි හෝ සේවකයන් විසින් එවනු ලබන අයැදුම්පත් සලකා බලනුයේ ඔවුන් විසින් ඒවා අදාල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කර කෙටි නිවේදනයකින් පසු මුදා හළ හැකියයි සහතික කර ඇතොත් පමණි.

(8) ඉල්ලුම්පත් සහ ඒ පිළිබඳ වෙනත් ලියුම් සියල්ලක්ම කොළඹ 1. තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානයේ 5 වන මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු නැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

(9) මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරවා ඇති, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම් පිළිබඳ පොදු කොන්දේසි වලටද අවධානය යොමු කෙරේ.

එච්. සී. ඇස්. ඒ. ගුණවර්ධන,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

කොළඹ 1,
තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානයේ,
පස්වන මහලේ,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයේ දී ය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

1. අයැදුම්කරුගේ සම්පූර්ණ නම : (පැහැදිලිව ලොකු අකුරෙන්) :————.

   (අ) වාසගම :————.

   (ආ) වෙනත් නම් :————.

2. තැපැල් ලිපිනය :————.

3. උපන් දිනය :—

   (උප්පැන්න සහතික පිටපත් ඇමිණිය යුතුය.)

   1973. 12. 31 දිනට වයස : අවු :——, මාස :——, දින :——.

4. ලාංකිකයෙක් ද ? එසේ නම් :—

   (අ) පරම්පරාවෙන් ද ? :————.

   (ආ) ලියාපදිංචි වීමෙන් ද ? :————.

5. විවාහක ද, අවිවාහක ද යන වග :————.

6. අධ්‍යාපනික සුදුසුකම් : (පිටපත් ඇමිණිය යුතුය.) :————.

7. වෘත්තීය හෝ කාර්මික සුදුසුකම් : (පිටපත් ඇමිණිය යුතුය.) :————.

8. පාසැලෙන් අස්වූ පසු කරන ලද රැකියාවන් :————.

9. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් : (පිටපත් ඇමිණිය යුතුය.) :————.

10. විශේෂ සුදුසුකම් ආදිය:————.

මවිසින් ඉහත සඳහන් කර තිබෙන සියලුම විස්තර සත්‍ය හා නිවැරදි කරුණු බව මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව ඔප්පුවුවහොත්, මේ තනතුරු සඳහා තෝරාගැනීමට පෙර මා නොසුදුස්සෙකු වන බවත්, පත්වීමෙන් පසු විරුද්ධ අනාවරණය වී නම් කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලබන බව මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

12–438—72.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

## වී අලෙවි මණ්ඩලය

### සිවිල් ඉංජිනේරු තනතුර—II වෙනි ශ්‍රේණිය

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම් පත් 1973 දෙසැම්බර් මස 31 වැනි දිනට පෙර කොළඹ 5, එලිබෑන්ක් පාරේ, අංක 5 දරණ ස්ථානයේ පිහිටි වී අලෙවි මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අධ්‍යාපනික, චරිත හා උප්පැන්න සහතිකවල පිටපත් ද ඒ සමග එවිය යුතුය. අයදුම් පත්‍ර අඩංගු ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "සිවිල් ඉංජිනේරු තනතුර සඳහා ඉල්ලුම් පත" යනු සඳහන් කළ යුතුය.

1. **අවශ්‍ය සුදුසුකම්.**—සිවිල් ඉංජිනේරු විද්‍යා ක්ෂේත්‍රයෙහි සම්පූර්ණ වෘත්තිය සුදුසුකම් ලබා තිබිය යුතු අතර වග කිවයුතු තනතුරුවල අවුරුදු 10 කට වැඩි සේවයක් තිබිය යුතුය. අයදුම්කරුවන්ට අවුරුදු 5 කට නොඅඩු පාලන පළපුරුද්දක් තිබිය යුතුය. සවි ගැන්වූ කොන්ක්‍රීට් ගොඩනැගිලි සැලසුම් කිරීම් හා ඉදිකිරීම් පිළිබඳව පළපුරුද්දක් ඇත්තවුන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—රු. 1,500—10×50—රු. 2,000 සියලු දීමනා සමග මසකට. සුදුසුකම් සහ පළපුරුද්ද සලකා බලා පත් කරනු ලබන තැනැත්තා මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමයේ වැටුප් පියවරක පිහිටුවනු ලැබේ.

3. **වයස.**—ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.

4. **පොදු කොන්දේසි :**

(අ) ලාංකිකයන් විය යුතුය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් යටත් වනු ඇත.

(ඉ) රජයේ සේවයේ හෝ සංස්ථා සේවයේ යෙදී සිටින්නවුන් විසින් ඉදිරිපත් කරන අයදුම් පත්‍ර දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් එවිය යුතුය.

සභාපති,
වී අලෙවි මණ්ඩලය.

අංක 5, එලිබෑන්ක් පාර,
කොළඹ 5,
1973 නොවැම්බර් මස 19 වෙනි දින.

12–430—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## වී අලෙවි මණ්ඩලය

### සහකාර ගබඩා පරිපාලක තනතුර—V වැනි ශ්‍රේණිය

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම් පත් 1973 දෙසැම්බර් මස 31 වැනි දිනට පෙර කොළඹ 5, එලිබෑන්ක් පාරේ, අංක 5 දරණ ස්ථානයේ පිහිටි වී අලෙවි මණ්ඩලයේ පරිපාලන අධිකාරි වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අධ්‍යාපනික චරිත හා උප්පැන්න සහතිකවල පිටපත් ද ඒ සමග එවිය යුතුය. අයදුම් පත්‍ර අඩංගු ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "සහකාර ගබඩා පරිපාලක තනතුර—V වැනි ශ්‍රේණිය සඳහා ඉල්ලුම්පත" යනු සඳහන් කළ යුතුය.

1. **අවශ්‍ය සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය පිළිබඳ උපාධියක් ලබා තිබිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—රු. 630—6×20—6×25—රු. 900 සියලු දීමනා සහිතව මසකට.

3. **වයස.**—අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.

4. **පොදු කොන්දේසි :**

(අ) ලාංකිකයන් විය යුතුය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා හා මතුවට පනවනු ලබන සියලුම නීතිරීති සහ ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කළ යුතුය.

(ඇ) රජයේ හා සංස්ථා සේවකයින් තම ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වනු නොලැබේ.

පරිපාලන අධිකාරි,
වී අලෙවි මණ්ඩලය.

තැ. පෙ. 205,
අංක 5, එලිබෑන්ක් පාර,
කොළඹ 5,
1973. නොවැම්බර් මස 30 වෙනි දින.

12–431—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### බෑන්ඩ් මාස්ටර් තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ බෑන්ඩ් මාස්ටර් තනතුරු සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරන ලද ඉල්ලුම් පත් 1974 ජනවාරි මස 05 වැනි දින හෝ ඊට ප්‍රථම කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ලේකම්ට ලැබෙන සේ එවිය යුතුය. කවරයේ උඩ වම් කෙළවරේ "බෑන්ඩ් මාස්ටර් තනතුරු" යනුවෙන් සඳහන් කළ යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—

(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්කරවනු ලබන්නන්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයන් නම්, ආධුනික කාලසීමාව අවුරුදු 3 ක් වන්නේය.

(iii) රජයේ සේවයක ස්ථිර තනතුරක ස්ථිර කරනු ලැබ සිටින නිළධාරියෙකු තෝරාගනු ලැබුවහොත්, ඔහුගේ පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ පදනම මතය.

(iv) පත්කරනු ලබන්නන් තමාට නියම කරනු ලබන දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය.

(v) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් ක්‍රමය : වාර්ෂිකව : රු. 2,640—15×60—රු. 3,540 යි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 40 ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

(ආ) අඩුම වශයෙන් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන අධ්‍යාපන සුදුසුකම් ලබා සිටිය යුතුයි.

(ඇ) ලංඩනයේ ට්‍රිනිටි සංගීත විද්‍යාලයේ V වැනි ශ්‍රේණිය (ප්‍රායෝගික සහ සෛද්ධාන්තික) හෝ බටහිර සංගීතය පිළිබඳ ඊට සමාන හෝ උසස් සුදුසුකම්.

(ඈ) සුෂිරවාද්‍ය සඳහා වූ ලෝහමය හෝ ලීවලින් සාදන ලද නලා 3 ක් හෝ ඊට වැඩි ගණනක් වාදනය කිරීමේ හැකියාවක් තිබිය යුතුය.

**සටහන :**

හමුදා හෝ පොලිස් හෝ තූර්යවාදක කණ්ඩායමක වාද්‍ය මණ්ඩලයක සිටි අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත 1 ඡේදයේ සඳහන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත්, දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියමිත දිනයට පෙර ලැබී ප්‍රමාදය පිළිබඳව සැළකිය යුතු කරුණු ඔහු විසින් ඉදිරිපත් කළහොත් පමණක්, ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ. කෙසේ වුවද, සෑම අයදුම්කරුවෙකු විසින් ම තමා ඉල්ලුම් පත්‍රයේ පිටපතක් නියමිත දිනට පෙර ලැබෙන පරිදි කෙළින්ම මෙම අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම්පත්වලට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ පාඨශාලා වන්ට ඇතුළුවීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතික භාරගනු නොලැබේ.)

(ආ) අධ්‍යාපන සහතික.

(ඉ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට පත් කරනු ලැබීමට ඇති යෝග්‍යතාවය පිළිබඳ මෑතදී ලබාගත් සහතික දෙකක් (දැනට රජයේ ස්ථිර සේවයේ සිටින අයදුම්කරුවන් විසින් මෙම සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

7. අයදුම්පත් හා ඊට අදාළ වෙනත් ලිපි, මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේ නිල ලිපිනයට හැර කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ, (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි කෙරෙහි ද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පසුවී දින 14 ක් ගෙවුනු කළ, අයදුම්පත ලද බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත වහාම දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියහොත්, තම අයදුම්පත සලකා බලනුවස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 දෙසැම්බර් මස 05 වන දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේදීය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය)

### බෑන්ඩ් මාස්ටර් තනතුරු

(1) නම (මුලකුරු සහිතව):————.

(2) සම්පූර්ණ නම :————.

(3) රාජකාරි ලිපිනය :————.

(4) පෞද්ගලික ලිපිනය :————.

(5) (අ) ලාංකිකයෙක්ද යන වග :————.

(ආ) එසේ නම් පරම්පරාවෙන්ද ? ලියාපදිංචි වීමෙන්ද ?————.

(6) ජාතිය :————.

(7) විවාහකද, අවිවාහකද යන වග :————.

(8) උපන් දිනය :——. අවුරුද්ද :——. මාසය :——. දිනය :——.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස :————.

අවුරුදු :——. මාස :—— දින :——.

(9) දැනට දරණ තනතුර පිළිබඳ විස්තර:—

(අ) තනතුර :————.

(ආ) ස්ථිරද, තාවකාලිකද ? :————.

(ඉ) විශ්‍රාම වැටුප් සහිත ද, රහිත ද ? :————.

(ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :————.

(උ) දෙපාර්තමේන්තුව :————.

(ඌ) ආයතනය/සේවා ස්ථානය :————.

(එ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.

(ඒ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.

(10) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :—

| විභාගය | වර්ෂය | මාධ්‍යය | විෂයයන් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

(11) වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :—

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

12. බෑන්ඩ් මාස්ටර් කෙනෙකු ලෙස පළපුරුද්ද ඇතොත් :—

| ආයතනය | දෙපාර්තමේන්තුව | දින | සිට | දින | දක්වා |
|---|---|---|---|---|---|
| | | | | | |

13. කලින් දැරූ තනතුරු (නියම දිනයන් දක්වමින් හරියටම වකවානු පිළිවෙලට සඳහන් කරන්න) :—

| දෙපාර්තමේන්තුව | ආයතනය/සේවා ස්ථානය | තනතුර ස්ථිරද තාවකාලිකද | සිට | දක්වා |
|---|---|---|---|---|
| | | | | |

14. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරු වී ඇත්තේද ? (එසේ නම් විස්තර දක්වන්න) :—— ——.

15. ඔබ රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේද ? (එසේ නම් විස්තර දක්වන්න) :—

16. ඔබ මුදල් කරදරවලින් නිදහස් ද, එසේ නොවේ නම් ඔබේ ණය තුරුස් වල ප්‍රමාණය කොපමණද ? :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුසු සඳහා බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—

12-459—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

අංකය : ගුවි/5/350

අධ්‍යාපන අමාත්‍යාංශය

## රජයේ ගුරු විද්‍යාලයන්හි I වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශයේ, ගුරු විද්‍යාලයන්හි පහත සඳහන් විෂයයන් සඳහා වූ I වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. (i) ඉංග්‍රී (සිංහල හා දෙමළ මාධ්‍යය) (ii) ගණිතය (සිංහල මාධ්‍යය) (iii) රසායන විද්‍යාව (සිංහල මාධ්‍යය). මෙහි පහතින් දක්වෙන ආකෘති පත්‍රය අනුව, පිළියෙල කරන ලද අයදුම්පත් 1974 ජනවාරි මස 4 වැනි දින හෝ ඊට පෙර **කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (ගුරු විද්‍යාල ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "රජයේ ගුරු විද්‍යාලයන්හි I වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු" යනුවෙන් සඳහන් කළ යුතුය.**

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**

(i) මේ තනතුරු ස්ථිරය. තෝරාගනු ලබන අපේක්ෂකයින් දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයින් වනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයින්, පත්වීම් ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන්නේ නම්, තව දුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයින්, දැනට රජයේ සේවයෙහි නියුක්ත නැතිනම්, මුල් වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක්මත පත් කෙරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියැලී ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු තෝරාගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම ගුරු විද්‍යාලයකට පත්කර යැවීමට යටත්වේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරු සඳහා වර්ෂයකට රු. 7,800 න් පටන් ගෙන රු. 360 වැටුප් වර්ධක 9 කින් රු. 11,040 දක්වා වැඩිවන ඒකාබද්ධ වැටුප් පරිමාණයක් අයත්ය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—(අ) විශිෂ්ට චරිතයකින් හා හොඳ ශරීර සනීප යෙන් යුක්ත බව ;

(ආ) 1974.01.04 දිනට වයස අවුරුදු 28 ට නොඅඩු බවට හා 50 ට නොවැඩි බවට, (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ඉ) අයදුම්කරුවන් පුහුණු උපාධිධාරීන් හෝ අධ්‍යාපන ඩිප්ලෝමා සහිත උපාධිධාරීන් විය යුතුය. උපාධිය ලැබීමෙන් පසු අවුරුදු 5 ක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබිය යුතු අතර, තමා ඉල්ලුම් කරන විෂයය හෝ විෂයයන් පිළිබඳව පහත දැක්වෙන පරිදි සුදුසුකම් ලබා තිබිය යුතුය.

(1) ඉංග්‍රීසි—උපාධියට ඉංග්‍රීසි විෂයයක් ලෙස ගෙන සමත් වී තිබිය යුතුය.

(2) ගණිතය—උපාධියට ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය විෂයයන් ලෙස ගෙන සමත් වී තිබිය යුතුය.

(3) රසායන විද්‍යාව—උපාධියට රසායනික විද්‍යාව විෂයයක් ලෙස ගෙන සමත් වී තිබිය යුතුය.

(ඊ) අයදුම්කරුවන්ට සිංහල/දෙමළ පිළිබඳව මනා සුදුසුකම් තිබිය යුතුය.

5. **පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලක්ම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—**

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඉ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඊ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(උ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ.යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ, (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම සම්බන්ධ යෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

1973 දෙසැම්බර් මස 05 වැනි දින.
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

---

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

අංකය :

(අඟල් 8½ × 13½ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය)

**අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු විද්‍යාලයන්හි I වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු**

1. නම (මුලකුරු සහිතව) :——— ——(මහතා/මිය./මෙනවිය)

2. සම්පූර්ණ නම :————.

3. රාජකාරී ලිපිනය :————.

4. පෞද්ගලික ලිපිනය :————.

5. (අ) ලාංකිකයෙක් ද යන වග :————.
   (ආ) එසේ නම, පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද :————.

6. උපන් දිනය :————.
   අවුරුද්ද :————, මාසය :————, දිනය :————.

7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස :–
   අවුරුදු :————, මාස :————, දින :————.

8. දැනට දරණ තනතුර පිළිබඳ විස්තර :—
   (අ) තනතුර :————.
   (ආ) ස්ථිරද, තාවකාලිකද :————.
   (ඉ) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද ? :————.
   (ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :————.
   (උ) දෙපාර්තමේන්තුව :————.
   (ඌ) ආයතනය/සේවා ස්ථානය :————.
   (එ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.
   (ඒ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.

9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල ප්‍රවීණතාවය/දෙමළ භාෂාව පිළිබඳ ලබා ඇති සහතිකද ඇතුළත්ව) :—

| විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|
| (1) | | |
| (2) | | |
| (3) | | |
| (4) | | |

10. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :—

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |
| (5) | | | |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතන :—

| ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |
| (5) | | | |
| (6) | | | |
| (7) | | | |

12. වෘත්තිය අධ්‍යාපනය ලද ආයතනය :—

| ආයතනය | පාඨමාලාව | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

13. කලින් දැරූ තනතුරු (නියම දිනයන් දක්වමින් හරියටම වකවානු පිළියෙලට සඳහන් කරන්න.)

| දෙපාර්තමේන්තුව | ආයතන සේවා ස්ථානය | තනතුර | ස්ථිරද/ තාවකාලිකද | සිට | දක්වා |
|---|---|---|---|---|---|
| | | | | | |

14. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරු වී ඇත්තේද? (එසේ නම් විස්තර දක්වන්න) :————.

15. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේද ? (එසේ නම් විස්තර දක්වන්න) :————.

16. ඔබ මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම් ඔබ ණයතුරුස්වල ප්‍රමාණය කොපමණ ද ? :————.

17. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් ධම දනිමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

12–458—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අරාබි ගුරුවරුන් පුහුණු කිරීම සඳහා තෝරාගැනීම

1. දෙමළ මාධ්‍යයෙන් අරාබි ගුරුවරුන් පුහුණු කිරීමේ දෑවුරුදු ආයතනික පාඨමාලාවක් අඩාලච්චේනෙයි ගුරු අභ්‍යාස විද්‍යාලයෙහි පවත්වනු ලැබේ.

මෙම පාඨමාලාව ප්‍රාථමික හා ද්විතිය පාසැල්වල අරාබි භාෂාව හා සමාන්තර විෂයයන් ඉගැන්වීම් වස් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා වේ.

(11) තම සාමාන්‍ය හැසිරීම හා ඉගෙනීමෙහි උද්‍යොගිභාවය සම්බන්ධයෙන් ගුරු විදුහලේ විද්‍යාලයාධිපතිවරයා තෘප්ත කිරීමට අසමත්වන පුහුණුව ලබන්නන්ගේ පාඨමාලාව හැදෑරීම අත්හිටවනු ලැබේ. මෙම කාරණය සම්බන්ධයෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(111) පුහුණුව ලබන්නකුට තම පාඨමාලාව හදරණ කාලය තුළ වෙනත් බාහිර පාඨමාලාවක් හැදෑරීමට හෝ බාහිර විභාගයකට පෙනී සිටීමට හෝ සාධාන්‍යයෙන් ඉඩ දෙනු නොලැබේ.

2. **ඇතුළත් කිරීම.**—(1) මෙම පාඨමාලාව පහත සඳහන් වර්ගවලට අයත් අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ. එබඳු අයෙකු ඇතුළත් වුවහොත් මෙම පාඨමාලාව පැවැත්වෙන කාලය ඇතුළත හෝ ඉන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ ඇතුළත්වීම අවලංගු කරනු ලැබේ :—

(අ) ගුරු විද්‍යාලයක දැනටමත් පුහුණුව ලබා ඇති හෝ දැනට පුහුණුව ලබන හෝ ගුරුවරුන් ;

(ආ) උපාධිය ලබා ඇති ගුරුවරුන් ;

(ඇ) ඉල්ලුම් පත්‍ර භාරගන්නා දින හෝ ඊට පෙර ;

4 වැනි ඡෙදයේ සඳහන් සුදුසුකම් පිළිබඳ කොන්දේසි සියල්ල සපුරා නොමැති ගුරුවරුන්.

(11) පුහුණුව සඳහා යැම අයදුම්කරුවෙකු විසින්ම ඇතුළත් කරගනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත සියළුම දීමනා සහිත වැටුපට හා පුහුණුවේ වියදමට ද සමාන වටිනාකමින් යුතු බැඳුම්කරයකට පහත සඳහන් නියමයන්ද පිළිපදින බවට පොරොන්දු වෙමින් ඇතුළත්වීමට අවශ්‍ය සියළුම ලියකියවිලි තම ගුරු විදුහලේ විදුහල්පතිවරයා වෙත සැපයිය යුතුය :—

(අ) පුහුණුව ලබන කාලය තුළ දේශපාලන කටයුතුවලට සහභාගී නොවන බවට ;

(ආ) කවර හේතුවක් නිසා වුවද, පුහුණුවීමේ පාඨමාලාව අත් නොහරින බවට ;

(ඇ) පුහුණු පාඨමාලාව නිම කිරීමේදී අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහු/ඇය පත්කරනු ලබන පාසැල්වල අවුරුදු අටක කාල පරිච්ඡෙදයක් නොකඩවා සේවය කරන බවට ;

(ඈ) නියමිත සේවා කාල පරිච්ඡෙදය සම්පූර්ණ කර බැඳුම්කරයේ නියමිත බැඳීම්වලින් සම්පූර්ණයෙන් නිදහස්වන තෙක් දෙපාර්තමේන්තුවෙන් පිටත වෙනත් තනතුරක් හෝ තවත් කාල පරිච්ඡෙදයකට අධ්‍යයන නිවාඩුවක් සඳහා හෝ ඉල්ලුම් නොකරන බවට.

3. **වැටුප.**—තම පාඨමාලාව සතුටුදායක ලෙස නිමකර ගුරු පත්වීම ලබන ආධුනිකයින්ට අළුත් පත්වීමේ දින සිට ඔවුන්ට එදිනට අදළ වැටුප් ක්‍රමය මත වැටුප් ගෙවනු ඇත.

4. **සුදුසුකම්.**—

(i) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය ;

(ii) ලංකාවේ පුරවැසියෙකු විය යුතුය ;

(iii) ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනයට පෙර ගුරුවරයෙකු වශයෙන් පත්වීමක් ලබා තිබිය යුතුය. එහෙත් තෝරාගැනීම් කරනු ලබන්නේ හුදෙක් ජ්‍යෙෂ්ඨතාව මතය.

(iv) 1974 ජනවාරි 01 වන දිනට වයස අවුරුදු 45 ට අඩුවිය යුතුය.

(11) පහත සඳහන් සුදුසුකම් ලබා නොමැති කිසිම අයදුම්කරුවෙකු දෙමළ මාධ්‍යයෙන් දෙවනු ලබන පාඨමාලාවක් සඳහා ඇතුළත්වීමට සුදුස්සෙකු නොවනවා ඇත :—

(අ) විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අල්–අලිම් ප්‍රාථමික විභාගයේ I වන හා II වන කොටස් ; හෝ

පිළිගත් මද්‍රසයකින් ලබාගත් අවසාන සහතිකය. මෙම කාර්යය සඳහා පිළිගත් මද්‍රස පහත දැක්වේ :—

1. බහ්ජතුල් ඉබ්‍රාහිමිය අරාබි විද්‍යාලයය කොටුව, ගාල්ල
2. කැෂෝරිය අරාබි විද්‍යාලය, ටහරගම
3. මද්‍රසතුල් බාරි අරාබි විද්‍යාලයය, වැලිගම
4. කාසිමියා අරාබි විද්‍යාලය, පුත්තලම
5. නාත්වතුල් උල්මා අරාබි විද්‍යාලයය, මුත්තූර්

6. නැගෙනහිර ලංකා අරාබි විද්‍යාලයය, අඩ්ඩාලච්චේනෙයි

7. මද්රසසතුල් ෆිාලා අරාබි විද්‍යාලයය, කාතන්කුඩි

8. මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයය, කල්එලිය

9. මද්රසතුල් සිෆ්රියා අරාබි විද්‍යාලයය, ගාල්ල

10. නියතිය අරාබි විද්‍යාලයය, පැරනි නගරය, මාදම්පේ

11. නාත්වතුල් බුහාරි අරාබි විද්‍යාලයය, කින්නියා

12. මද්රසතුල් නූරියා, කොටුවෙගොඩ, මාතර

5. **තෝරාගැනීම සඳහා ඉල්ලුම් කිරීම.**—(1) මෙම ගැසට් නිවේදනයේ දක්වෙන ආදර්ශ ආකෘතිය අනුව අයදුම්කරු විසින් පිළියෙල කරගනු ලබන අයදුම් පතක් සම්පූර්ණ කොට එමගින් ඉල්ලුම් කළ යුතුය. ඉල්ලුම්කරු විසින් දෙමළ මාධ්‍යයෙන්ම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මුද්‍රිත ෆෝර්ම නිකුත් කරනු නොලැබේ. ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේදී පහත දක්වෙන නියමයන් තරයේ පිළිපැදිය යුතුය. මින් කවර හෝ නියමයක් නොසලකා හැරීම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වන්නේය.

(අ) ආකෘති පත්‍රය දළ වශයෙන් 16″ × 13″ ෆුල්ස්කැප් පිටුවක පිළියෙල කළ යුතු අතර, වෙනත් කවර හෝ කඩදාසියක පිළියෙල නොකළ යුතුය.

(ආ) ආකෘති පත්‍රය යතුරු ලිවීමෙන් පිළියෙල කරගත හැකිය. එය අත්අකුරින් පිළියෙල කරන්නේ නම් රතු තීන්තෙන් සකස් කර ගත යුතුය. කොටු පිරවීම කළයුත්තේ නිල් හෝ කළු තීන්තෙනි.

(ඇ) කොටු ඉරිගසා පිළියෙල කරගත යුතු අතර, ඒවා ක්‍රමානුකූලවත්, නිවැරදිවත් සටහන් කළ යුතුය. එකම කොටුවක්වත් වෙනස් කිරීම හෝ අත්හැරීම නොකළ යුතුය. කොටු අතර ඉඩ ප්‍රමාණය සැලකිල්ලෙන් වෙන්කළ යුතු අතර, එකිනෙකට ගොඩගැසෙන සේ පිළියෙල නොකළ යුතුය.

(2) අයදුම්කරු විසින් ඉල්ලුම් පත්‍රය නොඅඩුව හා නිවැරදිව පිරවිය යුතුය. අසම්පූර්ණ ඉල්ලුම් පත්‍රයක් පිළිගැනීම එහි අන්තර්ගත විස්තර අනුව නිරණය කරන අතර, ප්‍රතික්ෂේප කිරීමට ද ඉඩ තිබේ. පහත සඳහන් කරුණු කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ :—

(අ) ගුරුවරයෙකු විසින් තම නම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති පරිදිම සඳහන් කළ යුතුය.

(ආ) සෑම ගුරුවරයකු විසින්ම ඔහු/ඇය ගුරුවරයෙකුද නැතහොත් ශිෂ්‍ය ගුරුවරයෙකුද යන බව සඳහන් කළයුතු අතර, පත්වීමේ දිනය හා ලියාපදිංචි කිරීමේ අංකයද ඇතුළත් කළ යුතුය.

(ඇ) ඉල්ලුම් පත්‍රය ගුරුවරයා සේවය කළ පාසලේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය කවරයක් තුළ බහා, එම කවරයේ වම් පැත්තේ උඩින් "(දෙමළ) අරාබි භාෂා ගුරුවරුන් සඳහා පුහුණු කිරීමේ පාඨමාලාව" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ඉ) ඉල්ලුම් පත්‍ර, 1973.12.31 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය :—

අධ්‍යාපන අධ්‍යක්ෂ,

ගුරු අධ්‍යාපනය,

අධ්‍යාපන අමාත්‍යාංශය, මැලේ වීදිය, කොළඹ 2.

(3) ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

(4) ඉල්ලුම් පත්‍රයට ලියකියවිලි අමුණා එවිය යුතු නොවේ.

පී. උඩගම,
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය,
කොළඹ 2,
1973.12.05 දින.

1974 වර්ෂයේදී අරාබි ගුරුවරුන් වශයෙන් පුහුණු කිරීම සඳහා තෝරාගැනීමේ ඉල්ලුම් පත්‍රය
දෙමළ මාධ්‍යය

1. ස්ත්‍රී පුරුෂ භාවය : අදාළ කොටුවේ × මගින් පෙන්වන්න පිරිමි [ ] ගැහැණු [ ]

---

2. (i) සම්පූර්ණ නම : (පෙළපත් නාමය මුලට) :————.

(ii) භාවිතා කරන අයුරු මුලකුරු සමග නම :————.

3. පත්වීමේ දිනය :————.

4. ගුරුවරයෙකු වශයෙන් ලි. ප. අංකය :————.

---

5. ලිපිනය : පාසල් ලිපිනය :————.

වර්ගය : (රජයේ/ගාස්තු අය කරන පුද්ගලික/ගාස්තු අය නොකරන පුද්ගලික/අනුමත පුද්ගලික/පිරිවෙන්) :————.

අධ්‍යාපන දිස්ත්‍රික්කය :————.

ඡන්ද කොට්ඨාශය :————.

6. ස්ථිර ලිපිනය :————.

දිස්ත්‍රික්කය :————.

ඡන්ද කොට්ඨාශය :————.

---

7. උත්පත්තිය :

උපන් දිනය :————.

8. 1974.01.01 දිනට වයස :

අවු :————. මාස :————. දින :————.

9. ඔබගේ වයස පෙන්නුම් කර කොටුව ලකුණු කරන්න :

| 18—23 | 23—28 | 28—32 | 32—40 |
|---|---|---|---|
| | | | |

| 10. සමත්වූ අරාබි උසස් විභාගයේ විස්තර | විභාගයේ නම | සහතිකයේ අංකය හා ලබාගත් ආයතනය | දිනය | සමත්වූ විෂයයන් |
|---|---|---|---|---|
| | | | | |

| 11. අ.පො.ස. විභාගයේදී ඔබ ලබා ඇති ශ්‍රේණීන් මෙම අන්දමට ලකුණු කරන්න | විභාගය | වර්ෂය හා මාසය | සහතිකයේ අංකය | සමත්වූ විෂයයන්ගේ නම් සහ ලබාගත් ශ්‍රේණිය | | | | | | | | විශිෂ්ට සාමාර්ථ ගණන | සම්මාන සාමාර්ථ ගණන | සාමාන්‍ය සාමාර්ථ ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාමාර්ථ—සා<br>සම්මාන—සම්<br>විශිෂ්ට—වි | අ.පො.ස. (සා.පෙ.) | | | | | | | | | | | | | |
| | අ.පො.ස. (උ.පෙ.) | | | | | | | | | | | | | |

12. සේවය :

| පාසලේ නම | ලිපිනය | දිස්ත්‍රික්කය | පත්වීමේ දිනය | ස්ථාන මාරුවීමේ දිනය |
|---|---|---|---|---|
| | | | | |

13. බාහිර ක්‍රියාකාරකම් :

(අ) ක්‍රීඩා :————.

(ආ) සමිති :————.

(ඉ) සමාජ වැඩ :————.

14. ඉල්ලුම්කරුගේ ප්‍රකාශය :—ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තර නිවැරදි බවට සහතික කරමි. ඉල්ලූ විටෙක සාක්ෂි ඉදිරිපත් කරන්නෙමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

15. පාසැල් ප්‍රධානියාගේ/මා.අ.නි. ගේ සහතිකය:—ඉහත නම සඳහන් ඉල්ලුම්කරු—

(i) මගේ පාසලේ/මණ්ඩලයේ උපගුරුවරයෙකු/මූල්ගුරුවරයෙකු බව,

(ii) ———— දින සිට ———— දින දක්වා ඔහුගේ/ඇගේ වැඩ සතුටුදායක බව,

(iii) සහතික පත්‍ර ලත්/සහතික පත්‍ර නොලත් ගුරු භවතෙකු බව,

(iv) මා ඉදිරියේ මෙම ආකෘතියේ අත්සන තැබූ බව මෙයින් සහතික කරමි.

පාසල් ප්‍රධානියාගේ/මා.අ.නි. ගේ නම :————.
තරාතිරම හා රාජකාරි ලිපිනය :————.

————,
පාසල් ප්‍රධානියාගේ/මා.අ.නි. ගේ අත්සන.
දිනය :————.

12-411—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**ගාල්ලේ බහුතාක්ෂණික ආයතනයේ ව්‍යාපාර අධ්‍යයන ජාතික ඩිප්ලෝමා දෑවුරුදු පූර්ණකාල දිවා පාඨමාලාවට සිසුන් ඇතුලත් කර ගැනීම—1974.**

ගාල්ලේ බහුතාක්ෂණික ආයතනයේ සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන ජාතික ඩිප්ලෝමා දෑවුරුදු පූර්ණකාලීන දිවා පාඨමාලාවට ඇතුලත් කර ගැනීම සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ. පාඨමාලාව 1974 ජනවාරි මාසයේදී ආරම්භ කෙරේ.

මෙම පාඨමාලාවේ අධ්‍යයන පිළිපාටිය පහත දැක්වෙන පරිදි වේ:—

**පළමුවෙනි අවුරුද්ද**

1. ඉංග්‍රීසි
2. ගණකාධිකරණය
3. වාණිජ නීතිය
4. ව්‍යාපාර කළමනාකාරිත්වය
5. සංඛ්‍යානය හා ව්‍යාපාර ගණිතය
6. බදුක්‍රම
7. යතුරු ලියනය (සිංහල හා ඉංග්‍රීසි)

**දෙවැනි අවුරුද්ද**

1. ඉංග්‍රීසි
2. ගණකාධිකරණය
3. වාණිජ නීතිය හා (විෂයයන් දෙකකින් යුත්) පහත සඳහන් කාණ්ඩ වලින් එකක්.

(අ) කාණ්ඩය—(විගණනය)
(4) විගණනය
(5) බදුක්‍රම

(ආ) කාණ්ඩය—(පිරිස් කළමනාකාරිත්වය)
(4) පිරස් කළමනාකාරිත්වය.
(5) කම්කරු නීතිය.

(ඇ) කාණ්ඩය—(අලෙවි කළමනාකාරිත්වය)
(4) අලෙවි කළමනාකාරිත්වය.
(5) ප්‍රචාරණය හා මහජන සම්බන්ධතා

(ඈ) කාණ්ඩය—(පිරිවැය ගණකාධිකරණය)
(4) පිරිවැය ගණකාධිකරණය
(5) ව්‍යාපාර තීරණ සඳහා ගණකාධිකරණය.

**බඳවා ගැනීම සඳහා සුදුසුකම් :—**

(අ) **වයස.**—අපේක්ෂකයින් 1974.1.1 දිනට වයස අවුරුදු 17 ට වැඩි විය යුතු අතර එදිනට වයස අවුරුදු 21 ට අඩුනම් වඩා යෝග්‍යය.

අධ්‍යාපන සුදුසුකම් :—

(1) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී විෂයයන් 3 කින් සමත් වී සිටිය යුතුය. මින් යටත් පිරිසෙයින් 2 ක් ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය සහ වාණිජ්‍යය හා මුදල් යන විෂයයන් අතුරෙන් විය යුතු අතර තුන්වැනි විෂය ඉහත දැක්වෙන විෂයයන්ගෙන් එකක් නොවේ නම්,

ආණ්ඩුක්‍රම, ශුද්ධ ගණිතය, භූගෝල විද්‍යාව, සිංහල, දෙමල, ඉංග්‍රීසි, තර්ක ශාස්ත්‍රය සහ ඉතිහාසය යන විෂයයන්ගෙන් එකක් විය යුතුය, නොඑසේ නම්,

(i) පොත් තබන්නන් සඳහා වූ උසස් වාණිජ සහතික පත්‍රය හෝ,

(iii) පොත් තබන්නන් සඳහා වූ වාණිජ විද්‍යා සහතික පත්‍රය හෝ,

(iv) වර්තක තරාතර පත්‍රම් විය යුතුය.

ලැබී ඇති අයදුම් සංඛ්‍යාව අනුව ශිෂ්‍යයන් තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණයක හා/හෝ ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත වනු ඇත.

මෙම පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තුවන අපේක්ෂකයින් පහත දැක්වෙන ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව පිළියෙල කරන ලද තම ඉල්ලුම් පත ගාල්ලේ, බහුතාක්ෂණික ආයතනයේ විදුහල්පති වෙත 1974. 1. 4 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. මෙම දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ටී. ඕ. පී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික අධ්‍යාපනය),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය,
කොළඹ 2.
1973. 12. 4.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ගාල්ල බහුතාක්ෂණික ආයතනයේ ව්‍යාපාර අධ්‍යයන ජාතික ඩිප්ලෝමාව සඳහා වූ ඇතුරුළු පූර්ණකාල දිවා පාඨමාලාවට ඇතුලත් කර ගැනීම—1974**

1. සම්පූර්ණ නම :———.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :———.

3. උපන් දිනය :———.

4. 1974. 1. 1. දිනට වයස :— අවුරුදු : ——, මාස : ——.

5. ජාතිය :———.

6. පියාගේ /මවගේ/භාරකරුගේ නම සහ ලිපිනය :———.

7. ඉගෙනීම ලැබූ පාසැල්වල නම් හා ලිපිනයන් :———.

8. සමත් වූ විභාග :———.

(අ) අ.පො.ස. (සා. පෙ.) විභාගය :———
වර්ෂය...........විභාග අංකය........ විෂයයෝ...........
විශිෂ්ඨ/සම්මාන/සාමාන්‍ය/සාමාර්ථය.

(ආ) අ.පො.ස. (උ.පෙ.)/උසස් වාණිජ සහතික පත්‍රය/වාණිජ සහතික පත්‍රය/වර්තක තරාතර සහතික පත්‍රය විභාගය :

(ඇ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සමත් වූ විෂයයන්:
වර්ෂය........... විභාග අංකය........... විෂයයෝ...........
විශිෂ්ඨ/සම්මාන/සාමාන්‍ය/සාමාර්ථය.

ඉහත දක්වෙන කරුණු නිවැරදි බව මින් සහතික කරමි.

———.
අයදුම්කරු/කාරියේ අත්සන.

දිනය :———.

12–4,7—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

**රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ආයුර්වේද ශාස්ත්‍රී (සී. ඒ.) පරීක්ෂණය සඳහා ලියාපදිංචි කිරීම—1974**

ඉහත සඳහන් බාහිර පරීක්ෂණ සඳහා 1974 වර්ෂය වෙනුවෙන් ලියාපදිංචි කිරීම පිණිස නියමිත සුදුසුකම් ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම පහත දක්වා ඇති අයුරු ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

ඒ සඳහා නියමිත සුදුසුකම් ඇති අපේක්ෂක අපේක්ෂිකාවන් මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව තමන් විසින්ම සකස් කරගන්නා ලද ඉල්ලුම්පත්‍ර නිසි අයුරින් සම්පූර්ණ කර 1974 ජනවාරි 15 වැනි දාට හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

1. **අධ්‍යයන කාලය**

(i) මෙම පාඨමාලාව පිළිබඳ අධ්‍යයන කාල සීමාව අවුරුදු 3 කි. ප්‍රාරම්භ, මධ්‍යම, අවසාන යන පරීක්ෂණ තුනකින් පාඨමාලාව සම්පූර්ණ වේ.

(ii) ඒ සඳහා අධ්‍යයන අවුරුද්ද සෑම වර්ෂයකම ජනවාරි මාසයෙන් ආරම්භව එම වර්ෂයේ දෙසැම්බර් මාසය දක්වා වේ.

2. **ලියාපදිංචි කිරීමේ සුදුසුකම්.**

(i) ආයුර්වේද ශාස්ත්‍රී (සී. ඒ.) පරීක්ෂණයට පෙනී සිටීමට බලාපොරොත්තුවන ස්ත්‍රී, පුරුෂ සෑම අපෙක්ෂකයෙක්ම පහත සඳහන් යෝග්‍යතා අනුව ආයු/විද්‍යාල සහ ආරෝග්‍යශාලා මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයීය බාහිර පරීක්ෂණ අංශයේ ලියාපදිංචි විය යුතුය.

(ii) පූජ්‍ය පක්ෂයටද මේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමට ඉඩ තිබේ.

(iii) **වයස**

(අ) නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලියාපදිංචිය ලබන අවුරුද්දේ ජනවාරි මස 1 වැනි දිනට වයස අවුරුදු 17 ක් සම්පූර්ණවී සිටිය යුතුයි.

එහෙත් 2—iv (ඈ) ඡේදය අනුව ලියාපදිංචියට ඉල්ලුම් කරන අපෙක්ෂක අපෙක්ෂිකාවන්ගේ වයස ලියාපදිංචිය ලබන අවුරුද්දේ ජනවාරි මස 1 වැනි දිනට අවුරුදු 21 ට නොඅඩුවිය යුතුය.

(ආ) ආයුර්වේද වෛද්‍ය ලියාපදිංචිය ලත් සාමාන්‍ය/විශෙෂ ගණයේ වෛද්‍යවරයන් සඳහා මේ වයස් සීමා බල නොපවත්වයි.

(iv) **අධ්‍යාපනික යෝග්‍යතා.**—ආයුර්වේද ශාස්ත්‍ර (සී. ඒ.) පරීක්ෂණය සඳහා ලියාපදිංචිවීමට පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ තිබිය යුතුය.

(අ) ප්‍රාචීන භාෂොපකාර සංගමයේ ප්‍රාරම්භ විභාගයෙන් හෝ විද්‍යොදය/විද්‍යාලංකාර පිරුවන් දෙකින් එකක ප්‍රාරම්භ පරීක්ෂණයෙන් සමත්ව සිටීම.

(ආ) රජය පිළිගත් අනෙක් පිරුවනක මධ්‍යම පරීක්ෂණයෙන් සමත්ව සිටීම.

(ඇ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන්, සිංහල භාෂාව ඇතුළුව විෂය පහකින් සමත්ව සිටීම.

(ඈ) පාඨශාලාවක 8 වැනි පංක්තියෙන් සමත්ව සාමාන්‍ය (සර්වාංග) ගණයේ ලියාපදිංචිය ලත් ආයුර්වේද වෛද්‍යවරයකු යටතේ අවුරුදු 5 කට නොඅඩු කාලයක් ආයු/වෛද්‍ය ක්‍රමය සම්බන්ධ අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලැබ වයස අවුරුදු 21 ට නොඅඩු අයකුවීම.

(ඉ) ආයුර්වේද විද්‍යාල සහ ආරෝග්‍යශාලා මණ්ඩලය මගින් පිළිගනු ලබන ආයුර්වේද වෛද්‍ය ආයතනයක පුහුණුව ලැබූ බවට සහතිකයක් ඉදිරිපත් කිරීම.

(ඊ) ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයකු වීම.

3. **පරීක්ෂණවලින් නිදහස් කිරීම.**—ඉහත සඳහන් ව්‍යවස්ථාවෙහි නිර්දේශිත පරිදි අවශ්‍ය සුදුසුකම් ඇති අපෙක්ෂක අපෙක්ෂිකාවන් පහත සඳහන් නිර්දේශ යටතේ ප්‍රාරම්භ/මධ්‍යම පරීක්ෂණ වලින් නිදහස් කිරීමට සලකා බලනු ලැබේ.

(i) ආයුර්වේද ශාස්ත්‍රී ප්‍රාරම්භ පරීක්ෂණයෙන් නිදහස් කිරීම සඳහා ආයු/විද්‍යාල සහ ආරෝග්‍යශාලා මණ්ඩලය විසින් පිළිගනු ලබන ආයු: වෛද්‍ය ආයතනයක ඒ හා සමාන තත්ත්වයේ සහතිකයක් ලබා සිටිය යුතුයි.

(ii) ආයුර්වේද ශාස්ත්‍ර මධ්‍යම පරීක්ෂණයෙන් නිදහස් කිරීම සඳහා ආයු: විද්‍යාල සහ ආරෝග්‍යශාලා මණ්ඩලය විසින් පිළිගනු ලබන ආයු: වෛද්‍ය ආයතනයක ඒ හා සමාන තත්ත්වයේ සහතිකයක් ලබා සිටිය යුතුයි.

(iii) ලංකායුර්වේද විද්‍යාචක්‍ර විභාගයේ ප්‍රාරම්භ විභාගයෙන් සමත්ව සිටින අපෙක්ෂකයන් ආයුර්වේද ශාස්ත්‍රී ප්‍රාරම්භ පරීක්ෂණයෙන්ද, ලංකායුර්වේද විද්‍යාචක්‍ර විභාගයේ මධ්‍යම පරීක්ෂණයෙන් සමත්වී සිටින අපෙක්ෂකයන් ආයුර්වේද ශාස්ත්‍රී මධ්‍යම පරීක්ෂණයෙන්ද නිදහස් කරනු ලැබේ.

(iv) රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ 1 වැනි වසර සී.ඒ.ඇම්.ඇස්. පරීක්ෂණය සම්පූර්ණ කිරීමට අපොහොසත් වන ශිෂ්‍යශිෂ්‍යාවන්ට ආයුර්වේද ශාස්ත්‍රී ප්‍රාරම්භ පරීක්ෂණය සඳහාද, 2 වැනි වසර සී.ඒ.ඇම්.ඇස්. පරීක්ෂණය හෝ 3 වැනි වසර සී.ඒ.ඇම්.ඇස් පරීක්ෂණය හෝ සම්පූර්ණ කිරීමට නොහැකිවන ශිෂ්‍යශිෂ්‍යාවන්ට ආයුර්වේද ශාස්ත්‍රී මධ්‍යම

පරීක්‍ෂණය සඳහාද, 4 වැනි වසර හෝ 5 වැනි වසර බී.ඒ.ඇම්.ඇස්. පරීක්‍ෂණ සම්පූර්ණ කිරීමට අපොහොසත් වන ශිෂ්‍යශිෂ්‍යාවන්ට ආයුර්වේද ශාස්ත්‍රී අවසාන පරීක්‍ෂණය සඳහාද පෙනී සිටීමට හැකිවන සේ ලියාපදිංචිය ලබාගැනීමට අවකාශ සලසනු ලැබේ.

(v) රජය පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයන්හි 1 වැනි, 2 වැනි, 3 වැනි, 4 වැනි සහ පස්වැනි වසර වෘත්තිය පරීක්‍ෂණයන් සම්පූර්ණ කිරීමට අපොහොසත්වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටද 3—iv ඡේදයේ දැක්වූ අයුරින් සාමාන්තර වනසේ ආයුර්වේද ශාස්ත්‍රී ප්‍රාරම්භ, මධ්‍යම, අවසාන යන පරීක්‍ෂණයන්ට පෙනී සිටීම සඳහා ලියාපදිංචිය ලබා ගැනීමට ඉඩ තිබේ.

සැ. යු.—(i) ආයුර්වේද ශාස්ත්‍රී අවසාන පරීක්‍ෂණය වෙනුවෙන් නිදහස් කිරීමක් නැත.

(ii) රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ඉගෙනීම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මේ පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

**4. ලියාපදිංචි කිරීම.**

(i) ආයුර්වේද ශාස්ත්‍රී (බී. ඒ.) පරීක්ෂණය සඳහා ලියාපදිංචිවීමට බලාපොරොත්තුවන අපේක්ෂක අපේක්ෂිකාවන් ඒ සඳහා නියම ෆෝර්මයෙන් ඉල්ලුම් කළ යුතුයි. ඒ සමග තමාගේ සුදුසුම් පිළිබඳ සහතිකවල පිටපත්ද එවිය යුතුයි.

(ii) සෑම අපෙක්ෂක අපෙක්ෂිකාවක්ම තමන් ආයුර්වේද වෛද්‍ය කර්මය පිළිබඳ පුහුණුව ලබන පිළිගත් ආයතනයෙන් හෝ වෛද්‍යවරයාගෙන් ඒ සම්බන්ධ සහතිකයක්ද ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි. (තමන් පුහුණුව ලබන ආයතනයේ හෝ වෛද්‍යවරයාගේ වෙනසක් ලියාපදිංචියෙන් පසුව ඇති වුවහොත් ඒ බව නොපමාව ලේඛකාධිකාරී වෙත දැන්විය යුතුය.)

(iii) ආයුර්වේද ශාස්ත්‍රී (බී. ඒ.) පරීක්ෂණයේ ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන යන පරීක්ෂණයන් සඳහා ලියාපදිංචිවීමට බලාපොරොත්තුවන අපේක්ෂක අපේක්ෂිකාවන් ආයු: විද්‍යාලයීය විභාග පාලක මණ්ඩලය මගින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂක මණ්ඩලයක් විසින් යොග්‍යපරිදි තෝරාගනු ලැබේ. ඒ අනුව තෝරාගත් බව හෝ තෝරා නොගත් බව ඒ ඒ අය වෙත දන්වනු ලැබේ. (ඒ සඳහා වලංගු මුද්දරයක් අලවා සිය ලිපිනය ලියන ලද ලියුම්කවරයක් ඉල්ලුම්පත්‍රය සමග එවිය යුතුයි.)

(iv) (අ) ලියාපදිංචි කිරීම සඳහා තෝරාගත් බව දැන්වූ විට ඒ ඒ අපේක්‍ෂක අපේක්‍ෂිකාවන් විසින් ලියාපදිංචි කිරීමේ ගාස්තුව නොපමාව **ලේඛකාධිකාරී** වෙත එවා ලදුපත්—රිසිට්පත් ලබාගත යුතුවේ.

(ආ) ලියාපදිංචි ගාස්තුව මුදල් ඇනවුම්—මනිඕඩර්ස් මගින් එවිය යුතු අතර ලියාපදිංචි ගාස්තුව ගෙවන තෙක් කිසිම අපෙක්ෂක අපෙක්ෂිකාවකගේ නමක් ආයුර්වේද ශාස්ත්‍රී (බී.ඒ.) පරීක්ෂණය සඳහා ලියාපදිංචි නොකරනු ලැබේ.

(v) ඉල්ලුම් පත්‍ර සම්මත කළ දින සිට එම අපෙක්ෂකයා/අපෙක්ෂිකාව ආයුර්වේද ශාස්ත්‍රී (බී. ඒ.) පරීක්ෂණය සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

(vi) මෙම ලියාපදිංචිය ආයුර්වේද ශාස්ත්‍රී (බී. ඒ.) පරීක්ෂණය පිළිබඳ සියලුම නීතිරීතිවලටත් කොන්දේසිවලටත් යටත් වේ.

(vii) පිළිගත් ආයතනයන්ට බැඳී සිට එමගින් ලියාපදිංචිය ලබා එහි ඉගෙනීමේ වැඩ අවසන් නොකළ ශිෂ්‍යයකුට/ශිෂ්‍යාවකට ආයුර්වේද ශාස්ත්‍රී (බී.ඒ.) පරීක්ෂණයට පෙනී සිටිය හැක්කේ පුද්ගලිකව සාමාන්‍ය ගණයේ ලියාපදිංචියලත් වෛද්‍යවරයකු යටතේ ඉගෙනීම ලබන බව ඔප්පු කිරීමෙන් පසු අභිනව ලියාපදිංචියක් ලබාගැනීමෙනි. ඒ සඳහා ලියාපදිංචි වීමේ ගාස්තුව අලුතින් ගෙවිය යුතුය.

(viii) ආයුර්වේද ශාස්ත්‍රී (බී. ඒ.) පරීක්ෂණයේ ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන යන පරීක්ෂණයන්ට ලියාපදිංචි වීමෙන් අවුරුද්දකට පසු සහ අවුරුදු 2 ක් ඇතුලතදී තමන් ලියාපදිංචිය ලත් පරීක්ෂණයට පෙනී නොසිටියහොත් එම ලියාපදිංචිය අවලංගු වේ.

එසේ අවලංගුවූ විට නැවත ලියාපදිංචිය සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුව අලුතින් ගෙවිය යුතුය.

**5. ආයුර්වේද වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි කිරීම**

ආයුර්වේද ශාස්ත්‍රී (බී ඒ.) උපාධි සහතිකය ලැබීමට සුදුසු අයගේ නම් වෘත්තිය සහතිකයක් ලදුවන් වශයෙන් සලකා එම උපාධිධාරීන් සාමාන්‍ය ගණයේ ආයුර්වේද වෛද්‍යවරුන් වශයෙන් ලියාපදිංචි කිරීමට ආයුර්වේද වෛද්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**6. ලියාපදිංචි කිරීම, පරීක්ෂණ (විභාග) සහතික පත්‍ර සහ ව්‍යවස්ථා සහ පාඨමාලා නිර්දේශ ගාස්තු**

(i) ලියාපදිංචි කිරීමේ ගාස්තු :

ආයුර්වේද ශාස්ත්‍රී (බී. ඒ.) පරීක්ෂණයේ (ප්‍රාරම්භ මධ්‍යම/අවසාන) සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 25 කි.

(ii) පරීක්‍ෂණ (විභාග) ගාස්තු

**1. ප්‍රාරම්භ පරීක්‍ෂණය**

(අ) පළමුවර සම්පූර්ණ පරීක්‍ෂණයට පෙනී සිටීම සඳහා ගාස්තුව රු. 25 කි.

(ආ) අසමත් වන විෂයයන් සඳහා එක් වරකට එක් එක් විෂයක් වෙනුවෙන් රු. 10 බැගින් ගෙවිය යුතුය.

**2. මධ්‍යම පරීක්ෂණය**

(අ) පළමුවර සම්පූර්ණ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ගාස්තුව රු. 35 කි.

(ආ) අසමත් වන විෂයයන් සඳහා එක්වරකට එක් එක් විෂයයක් වෙනුවෙන් රු. 10 බැගින් ගෙවිය යුතුය.

**3. අවසාන පරීක්ෂණය**

(අ) පළමුවර සම්පූර්ණ පරීක්ෂණයට පෙනීසිටීම සඳහා ගාස්තුව රු. 50 කි.

(ආ) අසමත්වන විෂයයන් සඳහා එක් වරකට එක් එක් විෂයක් වෙනුවෙන් රු. 10 බැගින් ගෙවිය යුතුය.

(ඇ) අවසාන පරීක්ෂණයේ කායචිකිත්සා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා එක්වරකට රු. 25 බැගින් ගෙවිය යුතුය.

(iii) **සහතික පත්‍ර ගාස්තුව.**— ආයුර්වේද ශාස්ත්‍රී (බී. ඒ.) උපාධි සහතික පත්‍රය ලබාගැනීම සඳහා ගෙවිය යුතු ගාස්තුව රු. 10 කි.

(iv) **ව්‍යවස්ථා සහ පාඨමාලා නිර්දේශ.** පිටපතක් රු. 2 කි. තැපැල් වියදම ශත 65 කි. (තැපැල් ගාස්තුව සඳහා මුද්දර එවිය යුතුයි.)

(v) ලියාපදිංචි කිරීම, පරීක්‍ෂණ (විභාග), සහතික පත්‍ර සහ ව්‍යවස්ථා සහ නිර්දේශ මාලා ගාස්තු සඳහා එවනු ලබන මුදල්; මුදල් ඇනවුම්, මනිඕඩර්ස් මගින්, "ලේඛකාධිකාරී, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය, බණ්ඩාරනායකපුර, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

(vi) (අ) මෙම පරීක්‍ෂණය උදෙසා ගෙවනු ලබන ලියාපදිංචි කිරීම, පරීක්‍ෂණ (විභාග), සහතික පත්‍ර, ව්‍යවස්ථා සහ පාඨමාලා නිර්දේශ ආදියේ කිසිම මුදලක් ආපසු ගෙවනු නොලැබේ. එහෙත් වැරදීමකින් ගෙවන ලද ගාස්තු හෝ වැඩිපුර ගෙවා ඇති ගාස්තු ආපසු ලබාගත හැකිය. එසේ ආපසු ගෙවන විට එම මුදලින් සියයට 10% ක් අඩුකරනු ලැබේ.

(ආ) හදිසි අනතුරක් රොගොපද්‍රවයක් වැනි නොවැලැක්විය හැකි හේතුවක් නිසා පරීක්ෂණයකට පෙනී සිටීමට නොහැකිවන අපෙක්ෂක අපෙක්ෂිකාවන්ට පරීක්ෂණ (විභාග) ගාස්තුවෙන් හරිඅඩක් පමණක් ගෙවා ඊළඟ වර්‍ෂයේ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ. එහෙත් පරීක්ෂණ (විභාග) ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

**7. ලිපිගනුදෙනු**

ආයුර්වේද ශාස්ත්‍රී (බී. ඒ.) පරීක්ෂණය පිළිබඳ සියලුම ලිපිගනුදෙනු පහත සඳහන් ලිපිනයට කළ යුතු වේ.

ලේඛකාධිකාරී (බාහිර විභාග අංශය),
ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය,
බණ්ඩාරනායකපුර,
රාජගිරිය.

දුරකථනය : 94308, කොළඹ.
විදුලි පණිවිඩ : වෛදවිදු, රාජගිරිය.

**සටහන.**—මේ පරීක්ෂණයට අදාල වැඩි විස්තර දැනගනු සඳහා දැනට නිකුත් කර ඇති (සංශෝධිත) ව්‍යවස්ථා සහ පාඨමාලා නිර්දේශ පිටපතක් ලබා ගන්න. (6 වන ඡේදයේ iv කොටස බලන්න.)

ඇම්. ඇස්. පී. කුරේ විද්‍යාශේඛර,
ලේඛකාධිකාරී.

1973 දෙසැම්බර් මස 14 දින,
ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ දී ය,
රාජගිරිය.

ආදර්ශ පිටපත

රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය

ආයුර්වේද ශාස්ත්‍රී (බී. ඒ.) පරීක්ෂණය

ලියාපදිංචිවීමේ ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(ආයුර්වේද අංශය) 1974.

(මෙම අයදුම්පත්‍රය පිරවිය යුත්තේ ගැසට් නිවේදනයේ සඳහන් කරුණු හොඳින් කියවා තේරුම් ගැනීමෙන් පසු සහ එහි දැක්වෙන කරුණු අනුව බව සලකන්න.)

1. සම්පූර්ණ නම :————.
   (i) වාසගම :————.
   (ii) අනික් නම් :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————.

(1974 ජනවාරි 1 වැනි දිනට වයස : අවු.——, මාස——, දි.——.)

4. ස්ත්‍රී පුරුෂ භාවය :————.
5. ගිහි/පැවිදි බව :————.
   පැවිදි නම් සාමණේර/උපසම්පදා නාමය :————.
6. පුරවැසි බව (පාරම්පරික/ලියාපදිංචිය ලත්) :————.
7. විවාහක/අවිවාහක බව :————.
8. පියා/මව්/භාරකරුගේ නම :————.
   ලිපිනය :————.
9. ඉගෙනීම ලැබූ පාසැල/විද්‍යාලය/පිරිවෙන :————.
10. අධ්‍යාපනික සුදුසුකම් :————.
    (අ. පො. ස. සාමාන්‍ය පෙළ නම් සමත් විෂයයන්) :————.
11. ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන්නේ ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන යන තුනෙන් කොතම් පරීක්ෂණයටද? :————.
12. ප්‍රාරම්භ/මධ්‍යම පරීක්ෂණ වලින් නිදහස් කිරීමක් බලාපොරොත්තුවන්නේ නම් අංක 3 යටතේ ලබා ඇති සුදුසුකම් :————.
13. ආයුර්වේද අධ්‍යාපනය ලබන ආයතනයේ/ලියාපදිංචි වෛද්‍ය වරයාගේ නම :————.
    ලිපිනය :————.
14. අමුණා ඇති සහතික පිටපත් (මුල් පිටපත් ඇමිණිය යුතු නොවේ)
    1. අධ්‍යාපන සහතිකය/සහතික.
    2. වෛද්‍ය පරම්පරා සහතික.
    3. පිළිගත් ආයතනයේ/ලියාපදිංචි වෛද්‍ය වරයාගේ සහතිකය/සහතික.
    4. ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නම් එහි සහතිකය,
    5. චරිත සහතික දෙකක්—
       (i) :————.
       (ii) :————.
    6. උප්පැන්න සහතිකය :————.
15. වෙනත් කරුණු :————.
16. ඉහත සඳහන් කළ කරුණු සත්‍ය බව සහතික කරමි. එම කරුණු අසත්‍ය හෝ වැරදි හෝ අසම්පූර්ණ බව මගේ නම ලියාපදිංචි කිරීමට පෙර හෝ පසු දැන ගන්නට ලැබුණොත් අදාළ පරීක්ෂණය සඳහා මගේ ලියාපදිංචිය අවලංගු කරන බව මා දන්නා අතර, එයට එකඟ වන බවට පොරොන්දු වෙමි.

————.

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

මගේ විද්‍යාලයේ ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක/නායකීලිය නිලධාරියකු/මා පුද්ගලිකව හඳුනන කෙනෙකුවන ඉහත සඳහන් ඉල්ලුම්කරු අද දින මා ඉදිරිපිටදී මෙහි අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

(අනවශ්‍ය වචන කපා හරින්න).

ඉල්ලුම්කරුගේ අත්සන සහතික කරන්නාගේ අත්සන :————.

දිනය :————.

සහතික කරන්නාගේ නම :————.

සහතික කළ ස්ථානය :————.

තනතුර :————.

ලිපිනය :————

12-666—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් | ... | 73.12.07 | සිකුරාද | ... | 73.11.28 | බදාද | දහවල් 12.00 |
| | | 73.12.14 | සිකුරාද | ... | 73.12.05 | බදාද | දහවල් 12.00 |
| | | 73.12.21 | සිකුරාද | ... | 73.12.12 | බදාද | දහවල් 12.00 |
| | | 73.12.28 | සිකුරාද | ... | 73.12.19 | බදාද | දහවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. සිරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 අගෝස්තු මස 18 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.